## මූලාරම්භයේදී

කිසිවක් නුවූ කාලයක් විය. හිරවත්, සඳවත්, තාරකාවත් නොතිබූ ඒකාලයේ, ගහකොළ හා සතුන්ද, මනුෂ්‍යයෝද නුවූහ. සියල්ලෙන් හිස්බවක් පමණක් පැවැත්තේය.

අවුරුදු දසදහස් ගණනාවකට පෙරදී පවා සිටි කෙනෙක් ගැන අපි දනිමු. ඒ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේය.

අවුරුදු දෙදහසකට තරම් පෙරදී ක්‍රිස්තුස්වහන්සේ, උන්වහන්සේ සෑදූ ලෝකය වෙත පැමිණිසේක. තමන්-වහන්සේ මනුෂ්‍යයෙකුව තිස්තුන් අවුරුද්දක් පමණ මෙහි වාසය කළසේක. මුළුලෝක ඉතිහාසයේම, මෙබඳු මහත් පුදුමාකාර සිද්ධියක් වූයේ මෙපමණකි. ඉතින් එය සිදුවූවේ කෙසේද?

## ළදරුවෙක් උපන්නේය

අප සියල්ලන් ලෝකය වෙත පැමිණියේ යම් ආකාරයකින්ද, මුළු විශ්වයේ ස්වාමීන්වහන්සේද එලෙසින්ම ළදරුවෙකුව ලෝකය වෙත පැමිණිසේක.

ඉශ්‍රායෙල්වරුන්ගේ දේශයෙහිවූ නාසරෙත් නම් නගරයෙහි එක් තරුණ කන්‍යා ස්ත්‍රියක් වසය කළාය. ඇගේ නම මරියාය. දවසක්ද, මරියා වෙතට දේවදූතයෙක් පැමිණ මෙසේ කීවේය. "භයනොවන්න මරියා! දෙවියන්වහන්සේ ඔබ තුළින් මහත් පුදුම ක්‍රියාවක් කරණසේක. වැඩිකල් නොගොස් ඔබ බිළිඳු පුතෙකු බිහිකරන්නීය. ඔබ ඔහුට යේසුස් යන නම තැබිය යුතුය. වෙනත් සියලු පිරිමි ළමුන්ට වඩා ඔහු ඉතා වෙනස් කෙනෙක් වන්නේය. මක්නිසාද දෙවියන්වහන්සේම ඔහුගේ පියාණන් වනසේක. ඔහු ඉතා

උතුම් තැනැත්වහන්සේ වනසේක. මක්නිසාද උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයැයි කියනු ලබනසේක."

මරියා හට විවාහබස්දී සිටි මනුෂ්‍යයෙක් විය. ඔහුගේ නම යෝසෙප්ය. දවසක්ද, රාත්‍රියේ යෝසෙප් නොනිද, මේ සිදුවනදේ ගැන සිතමින් සිටින විට, ඔහු වෙත දේවදූතයෙක් පැමිණ මෙසේ කීවේය. "සැබවින් සිදුවන්ට යන්නේ මහත් පුදුමාකාර දෙයකි. ඔබ මරියා සරණපාවාගන්ට භය නොවිය යුතුය. ඇට ඔබ ඉතා හොඳින් සැළකිය යුතුය. රැකබලාගත යුතුය. ඈ පුතෙක් උපදවන්නීය. ඔහුට යේසුස් යයි නම තැබිය යුතුයි. මක්නිසාද උන්වහන්සේ තමන් සෙනඟ පාපයෙන් මුදගන්නාසේක" යනුයි.

මරියා සහ යෝසෙප් දෙවියන්වහන්සේට බොහෝසේ ප්‍රේමකළ බැවින් සියල්ලෙහිදී දෙවියන්වහන්සේට කීකරු වූහ. සිදුවන්ට තිබෙන දේ තේරුම්ගන්ට ඔවුන්ට ඉතා අපහසුවූ අවස්ථාවේදී පවා ඔව්හු උන්වහන්සේගේ හඬට කීකරු වූහ.

ඔවුන් දෙදෙනා විවාහ වී දරුවා ලැබෙන තෙක් බලාඋන්හ.

## යේසුස්වහන්සේට ඉඩක් නොවීය

ටික කලකට පසු අධිරාජයා දේශයේ වැසියන් ගණන්ගැනීමක් නියෝග කළේය. එසේ ගණන් ගැනීමේදී වඩා සාර්ථක ක්‍රමය වශයෙන් ඒ ඒ වැසියන් තම තමන්ගේ උපන් ගෙදරට යාමට නියෝග කරන ලදී. ඒ අනුව මරියාට සහ යෝසෙප්ට තමන් උපන් ගමවූ බෙත්ලෙහෙම නම් කුඩා නගරයට යාමට සිදුවිය. අවුරුදු සිය ගණනකට පෙරදී එහි මහා බලවත්ත දාවිත් රජ වාසයකළේය.

නාසරෙත් නගරයේ සිට බෙත්ලෙහෙම පිහිටා ඇත්තේ බොහෝ දුරින්ය. ඒකාලයේදී ගමන් පහසුව පිණිස මෝටර්

රථ හෝ බස් රථ තිබුනේ නැත. කෙතරම් දුරගමනක් වුවත් පයින් යායුතුව තිබුණේය. කලාතුරකින් බූරුවන් පිටද එබඳු දුර ගමන් ගියහ. යෝසෙප් මරියාගේ පහසුව පිණිස ඈ බූරුවකු පිට හිඳුවා කැඳවාගෙන යන්නට ඇත.

බොහෝ උෂ්ණවූ ධූලි සහිත මාර්ගයක ඔවුන්ට යන්ට සිදුවිය. ඒ නිසා ඔවුන්ට ගමන සඳහා බොහෝකල් ගතවිය. ඔවුන් බෙත්ලෙහෙම් නුවරට ළඟාවනවිට, ඉතා විඩාවට පත්ව සිටි හෙයින් නැවතීමට තානායමක් කරාගියෝය. "කරුණාකර අපට නවතින්ට කාමරයක් ලබාදෙන්ට පුළුවන්ද"යි යෝසෙප් තානායම්කරුගෙන් විමසුවත් ඒ වනවිට කාමර සියල්ල සෙනඟගෙන් පිරීගොස් තිබුණි. කොතැනකවත් ඔවුන්ට ඉඩක් තිබුණේ නැත. ඔවුන් කොතැනකට යන්ටද?

අන්තිමේදී කෙනෙක් කථාකොට "මගේ ගවගාලක් ඇත. ඔබට එහි කුඩා ඉඩක් ලබාගත හැකිවේවි" යයි කීවේය. එයින් තෘප්තියට පත් මරියා සහ යෝසෙප් සතුන් අතරේ නවාතැන් ගත්තෝය. ඉතා විඩාවට පත්ව සිටි ඔවුන් එබඳු තැනක් ලැබීම ගැන සෑහීමකට පත්වූහ.

එම රාත්‍රියේදීම ළදරුවා උපන්නේය. මුළු විශ්වයේ ස්වාමියාවූ තැනැත්තේ දුගී ගවගාලකදී උපත ලැබුවේය. මරියා තම බිළිඳු දරුවා පොරෝණයකින් එතුවාය. එසේකොට ඈ ඔහු සතුන් කෑම කන ගවඔරුවේ පිරිසිදු පිදුරු මත උණුසුම්ව නිදිකරවූවාය. එහිවූ සත්තු ඔවුන්ගේ කෑමකන ඔරුවේ කුඩා බිළිඳෙකු නිදනු දැක මවිතවන්නට ඇත.

## එඬේරු ශුභ ආරංචිය ඇසූහ

ඒ රාත්‍රියේදී සමහර මනුෂ්‍යයෝ එළිමහනේ, තම බැටළු රංචු රැකබලා ගනිමින් සිටියෝය. ඔවුන් එඬේරුන්

වශයෙන් හඳුන්වනු ලබති.

හදිසියේම විදුලි කෙටීමක් බඳු දිළිසෙන ආලෝකයක් ඔව්හු දුටුවෝය. එයින් අවට සියල්ල ආලෝකමත්ව බබලන්ට විය. එඬේරු බියපත්වූහ. මේ කුමක්දැයි බැලූ ඔව්හු බබලන දේවදූතයෙක් එතැන දුටුවෝය.

ඔහු ඔවුන්ට කථාකොට "භයනොවන්න! මම ඔබවෙත මහත් පුදුම උපදවන ශුභාරංචිය ගෙන ආමි. මේ රාත්‍රියේදී ලෝකයේ මිදුම්කරුවාණන්වහන්සේ උපන්සේක. බෙත්-ලෙහෙමට ගොස් පොරෝණයකින් ඔතා ගවයන් තණ කන ඔරුවක, ගවගාලක් තුළ නිදාසිටින උන්වහන්සේ දැකගන්න" යයි කීවේය.

බැලූකළ මුළු අහස්කුස දේවදූතයන්ගෙන් පිරීතිබුණි. ඔව්හු ගීයක් ගයමින් "ස්වර්ගයෙහි ඉතා උසස්තැන්හී වැඩවසන දෙවියන්වහන්සේට මහිමයත් ලෝකයාට සමාදානයත් වේවා"යි කීහ. එයින්පසු එම ස්වර්ගීය දර්ශණය නොපෙනී ගියේය. මේ දර්ශණයෙන් එඬේරු මහත්සේ පුදුමයට පත්වූහ. සියල්ලෝම මහත්සේ ප්‍රීතියට පත්ව; එන්න! අපි සියල්ලෝම බෙත්ලෙහෙමට ගොස්. සිදුවී ඇති මේ මහත් පුදුම සිදුවීම බලමු යැයි එකවරම කථාකර ගත්හ.

ඔවුහු ඉතා වේගයෙන් ඔවුන්ගේ ගමන දිවගියහ. අන්තිමේදී ඔව්හු එකී ගවගාල වෙත පැමිණ එහි නිදාහුන් ගැළවුම්කරුවාණන් බැහැදුටහ. එඬේරුන් දුවයනවා දුටු තවත් බොහෝ මනුෂ්‍යයෝ ඔවුන් අනුව දුවගොස් එතැනට රැස්වූහ. එඬේරු පුන පුනා තමන් දුටු දේවදූතයන්ගේ පුවත එතැනට රැස්වූ සමූහයන්ට ප්‍රකාශකළෝය.

මේ සිද්ධියෙන් අවුරුදු සියගණනකට පූර්වයේදී දෙවියන්වහන්සේ; ලෝකයාට ගැළවුම්කරුවාණන් එවන බවට පොරොන්දුවක් දී තිබුණේය. මෙසේ කිරීමෙන් දූන්

උන්වහන්සේ එම පොරොන්දුව ඉටුකළසේක. ගැළවුම්-කරුවාණන්වහන්සේ පැමිණිසේක. දෙවියන්වහන්සේ සඳකල්හිම උන්වහන්සේගේ ගිවිසුම් ඉටුකරනසේක.

සතියකට පසු මරියා සහ යෝසෙප්, දරුවා දේවමාලිගාවට ගෙනගියෝය. එහිදී උන්වහන්සේට "**යේසුස්**" යන නම තැබුවෝය.

## පඬිවරුන්ගේ පැමිණීම

යේසුස්වහන්සේ උපන් කලයේදී "හෙරොද්" නම් ඉතා දුෂ්ට රජකෙනෙක් සිටියේය. මේ දවස් වන විට මහා පඬිවරුන් යයි නම්ලත් කිහිපදෙනෙක් පෙරදිගින් පිහිටි රටවල සිට, යෙරුසලම නම්ලත් අගනුවරට පැමිණියෝය. ඔව්හු නොයෙක් තැන්වලදී යුදෙව්වන්ගේ රජවන පිණිස මෙහි උපන් රාජකුමාරයා කොහිදැයි මනුෂ්‍යයන්ගෙන් විමසන්නට වූහ. ඔව්හු මෙසේද කීහ. "අපි අහසේ අලුත් තාරකාවක් දුටිමු. එහි අර්ථය වියයුත්තේ ඉතා විශිෂ්ඨ රජෙක් උපන්සේක යනුයි. අපි උන්වහන්සේ සිටින තැන සොයාගෙන නමස්කාර කරණු පිණිස පැමිණියෙමු".

මේ පුවත හෙරොද් රජ වෙත පැමිණිකළ ඔහු කැළඹී ගියේය. රට වැසියා ඔහු පිළිකුල් කරණබව දන්හෙයින් ඔහුට විරුද්ධව ඔවුන් කැරළිගසනු ඇතැයි සිතා මේ ළදරු කුමරුවාගෙන් නිදහස්වීමට උපායක් සිතාගත්තේය.

ඔහු තම රාජ්‍යයේ යුදෙව් නායකයන්ගේ රැස්වීමක් කැඳවා ඔවුන්ට මෙසේ කරුණු පැහැදිළි කළේය. "දෙවියන්වහන්සේ; ලෝකයා වෙත ගැළවුම්කරුවෙකු එවන බවට ගිවිසුමක් කොට ඇතිබැව් දනිමි. උන්වහන්සේ එම ගැළවුම්කරුවාණන් උපදින ස්ථානයත් උන්වහන්සේගේ පණිවුඩකරුවන්ට දන්වා තිබුනාදැ"යි ඔවුන්ගෙන් විමසූවිට ඔව්හු;

"එසේය; රජතුමෙනි! දෙවියන්වහන්සේගේ පණිවුඩ-කරුවකුව සිටි මීකා අනාගතවක්තෘ, ගැළවුම්කරුවා-ණන් උපදින ස්ථානය බෙත්ලෙහෙම බව ලියා තිබුණි" යැයි පිළිතුරු දුන්නෝය.

ඉන්පසු, මේ දුෂ්ට රජු ශාස්ත්‍රවන්තයන් වෙත රහසින් දූතයන් යවා, තමා හමුවට පැමිණෙන ලෙස ඔවුන්ට ආරාධනා කළේය. එසේ පැමිණි ඔවුන්හට, තමාත් එම ගැළවුම්කරුවාණන්ට නමස්කාර කළයුතු බව කියා, ඔවුන් තරකාව දුටු මොහොත විමසා දැනගත්පසු, බෙත්ලෙහෙම් නුවරට ගොස් කුමරුවා ඉපිද සිටින තැන සොයා දැනගෙන, තමාටත් එහි ගොස් නමස්කාර කරන්ට හැකිවනු පිණිස ආපසු විත් තමාටද දැනුම් දෙන ලෙස ඉල්ලා සිටියේය.

ඔව්හු රජමාලිගයෙන් නික්මගොස් රාත්‍රියේ අහස පරීක්ෂාකළ විට තාරකාව බෙත්ලෙහෙම් නගරයට ඉහළ අහසේ දිළිසෙමින් තිබුණ බව දැකීමෙන් ප්‍රීතියට පත්වූහ.

වහා එහිගොස් කුමරුවාණන්, මරියා සමඟ සිටිනු දැක, තම නලල් තල පොළොවට තබා මහත් ප්‍රීතියෙන් සහ ගෞරවයෙන් නමස්කාර කළෝය. ඉන්පසු නැගීසිට තම තමන් ගෙන ආ මහත් අගය ඇති පඬුරු විවෘතකොට උන්වහන්සේට පූජාකළෝය.

නමුත් හෙරොද් රජුගේ ඉල්ලීම පරිදි යෙරුසලමට නොගොස් වෙනත් මාර්ග වලින් ඔවුනොවුන්ගේ දේශයන් කරා ගියෝය. එසේ කළේ දෙවියන්වහන්සේ සිහිනයකින් කථාකොට ඔවුන්ට යෙරුසලමට නොගොස් වෙනත් මාර්ගවලින් එසේ ආපසු යන ලෙස නියෝගකළ නිසාය.

දෙවියන්වහන්සේ තවත් කෙනෙකුට සිහිනෙන් කථාකළසේක. ඒ යෝසෙප්ටය. "වහා නැගිට දරුවාත්, මරියාත් රැගෙන මිසරයට පලාගොස් මා කියන තුරුම එහි වාසයකළ යුතුය. මන්ද හෙරොද් රජු දරුවා මරාදමන්නට

උත්සාහයක් කරන්නේ"යයි කීසේක. එම රාත්‍රියේම යෝසෙප් සහ මරියා නැගිට දරුවාත් රැගෙන මිසරයට පලාගියෝය.

මේ වනවිට යෙරුසලමෙහි, හෙරොද් රජු ශාස්ත්‍රවන්තයන් තමාවෙත හැරී එනතුරු නොඉවසිල්ලෙන් බලාසිටියේය. ඔවුන් තමා රවටා ඇතිබව දැනගත්විට ඉතා කෝපවිය. ඔහු හේවායන් කැඳවා, බෙත්ලෙහෙමට ගොස් එහි සිටින අවුරුදු දෙකක් සහ ඊට අඩු වයස්වන සියලු පිරිමි දරුවන් මරණ ලෙස නියෝගයක් කළේය.

ඔහු අවුරුදු දෙක සිට පහළට සියලු පිරිමි දරුවන් මරාදමන ලෙස නියෝග කළේ ශාස්ත්‍රවන්තයන්, තමන් ඒ තාරකාව දුටුවේ අවුරුදු දෙකකට පෙරදී යැයි කිවූ නිසාය. දුෂ්ට හෙරොද් රජු කුඩා යේසුස් කුමරුවා නියතවශයෙන්ම ඔහුගේ ක්‍රියාවෙන් මරණයට පත්වන්ට ඇතැයි විශ්වාසකළේය.

කොයිතරම් දුෂ්ට බලවන්තයෙකුට වුවත් දෙවියන්-වහන්සේගේ සැලැස්මක් පෙරළා දමන්ට නුපුළුවන. යේසුස් ළදරුවා සුරක්ෂිතව වැඩෙමින් සිටියේය. ඒ අතර හෙරොද් රජු මරණයට පත්විය. මෙවිට මිසරයේදී දේවදූතයෙක් මරියාට සහ යෝසෙප්ට සිහිනෙන් පෙනී; "දැන් ඉතින් නැගිට යේසුස් කුමරුවාද ඔහුගේ මෑණියන්ද රැගෙන ආපසු ඉශ්‍රායෙල් දේශයට යන්න. දැන් එහිදී සම්පූර්ණ ආරක්ෂාව ඇතැ"යි දන්වන ලදී. මෙයින් පසු යෝසෙප් වහාම සිය පවුල රැගෙන ආපසු තම උරුම නිවසට පැමිණියේය.

## යේසුස්වහන්සේ ගුණ නුවණින් වැඩුණු සේක.

කුඩා දරුවෙකුව සිටි යේසුස්වහන්සේ ළමයෙකු මෙන් වැඩී පසුව තරුණයෙකු වූසේක. යේසුස් කුමරුට වයස දොළස වන විට, තම දෙමව්පියන් වූ මරියා සහ යෝසෙප්

සමඟ "පසුකරයාමේ මංගල්‍යය" පිණිස යෙරුසලමට වැඩිසේක. මංගල්‍යය අවසානවූ පසු මරියා සහ යෝසෙප්ද ආපසු නාසරෙත්හි තම නිවසට යනු පිණිස නික්මුණාහ. එහෙත් යේසුස් කුමරුවාණෝ ඔවුන් සමඟ නුවූසේක. නමුත් ඔවුන් ඒ ගැන නොසැලකුවේ උන්වහන්සේ තමන්වහන්සේගේ තවත් යහළු ළමුන් සමඟ එනවා ඇතැයි සිතාගෙනය. රාත්‍රියවූ විට නවාතැන් පිණිස සියල්ලන් එක්තැන් වුවද යේසුස් කුමරා එවිටත් පැමිණ නොසිටියේය. දෙමව්පියන් සෑමතැනම කුමරා ගැන විපරම් කළ නමුත් ඔවුන්ට උන්වහන්සේ ගැන තොරතුරක් දැනගන්ට නොලැබීම නිසා මහත්සේ කලබල වූහ.

ඔව්හු මුළු දුරම ආපසු ගමන්කොට යෙරුසලම වෙත පැමිණියෝය. එහිදීත් ඔවුන් දින තුනක්ම උන්වහන්සේ සොයමින් වෙහෙසවූහ. උන්වහන්සේ කොහේ වියහැකිදැයි ඔබට සිතන්ට පුළුවන්ද? උන්වහන්සේ තවමත් යෙරුසලම් දේවමන්දිරයේය. ව්‍යවස්ථාව පිළිබඳ මහා උගත් ආචාරීන් සමඟ උන්වහන්සේත් වාඩිවී ව්‍යවස්ථාවේ ඉතා වැදගත් තැන් සහ දෙවියන්වහන්සේ පිළිබඳ දැනීමේ ගැටළු ගැන සාකච්ඡාකරමින් හුන්සේක. මේ දොළොස්වන වියේ සිටි යේසුස් කුමරුවාගේ නුවණ සහ දැනීම ගැන සියල්ලෝම මහත්සේ පුදුමයට පත්ව සිටියහ.

යේසුස් කුමරුවන්ගේ දෙමව්පියන් උන්වහන්සේ සිටි තත්වය ගැන කුමක් සිතන්ටදැයි නොදැන වික්ෂිප්තව උන්හ. උන්වහන්සේගේ මෑණියෝ කථාකොට, "පුත්‍රය! ඔබ කුමක් නිසා අපව මෙසේ වෙහෙස කළාද? මමත් ඔබේ පියාත් මහත්සේ කලබලයට පත්ව සෑම තැනම ඔබ සෙවීමු" යි කීවාය.

"ඔබ එසේ කළේ කුමටද? මම මාගේ පියාණන්වහන්සේගේ නිවසෙහි සිටිය යුතුබව දැනසිටියේ

නැත්ද"යි විචාළසේක. යේසුස් කුමරුවාණෝ, දෙවියන්-වහන්සේ තම පියාණන්වහන්සේ බව දැන සිටිසේක. එහෙත් තමන් භූමික දෙමව්පියන්ට කීකරුව ඔවුන් සමඟ නාසරෙත් නුවරට වැඩිසේක.

කාලය ගෙවී ගියේය. යේසුස් කුමරුවාණෝ උස මහතින්ද ගුණ නුවණින්ද දෙවියන්වහන්සේගෙත් මනුෂ්‍යයාගේත් කරුණාවෙන්ද වැඩෙමින් වැඩිහිටියකු බවට පත්වූසේක.

## යේසුස්වහන්සේ බෞතීස්ම ලැබූසේක

ඒ දවස්වලදී ඉතා උත්තමයෙකුවූ යොහන් බෞතීස්ත නම් දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවෙක් වූයේය. ඔහුට එසේ කියනලද්දේ ඔහු විසින් ප්‍රකාශකරන ලද දෙවියන්වහන්සේගේ පණිවිඩය අදහාගත් සියල්ලන් බෞතිස්ම කළ නිසාය. "සියල්ලන් තමන් පව් ගැන පසුතැවී, පැමිණෙන ලෝකයේ ගැළවුම්කරුවාණන්වහන්සේ පිළිගැනීම පිණිස සූදානම් වියයුතුය"යි දේශනා කළේය.

දවසක්ද, යොහන් බෞතීස්ත කෙරෙන් බෞතීස්ම ලැබුවන් සමඟ යේසුස්වහන්සේද වූසේක. යේසුස්වහන්සේ යොහන් වෙතින් බෞතීස්ම ලැබ දියෙන් ගොඩවී, යාච්ඤා කළසේක. එවිට දෙවියන්වහන්සේ වෙතින්, පරවියෙකුගේ විලාශයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ බැස උන්වහන්සේ මත පිහිටුණුසේක. ඒ සමඟම ස්වර්ගයෙන් හඬක් නික්ම, "නුඹ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. නුඹ ගැන මම ඉතා ප්‍රසන්නව සිටිමි"යි කියනු සමූහයාට ඇසුණේය.

## ගෝලයන් දොළොස්දෙනා

එදිනට පසුවද යොහන් යේසුස්වහන්සේ පැමිණෙනු දුටුවේය. එවිට ඔහු තමන් සමඟ සිටියවුන් දෙදෙනාට උන්වහන්සේ පෙන්වා; "බලන්න ඒ එන්නේ ලෝකයාගේ පව්

දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළුපැටවාණෝ වනසේකැ"යි කීවේය. එවිට යොහන් සමඟ සිටි ඔවුන් දෙදෙනා ඔහු අතහැර යේසුස්වහන්සේ පසුපස ගියෝය. ඒ දෙදෙනා වනාහි යේසුස්වහන්සේගේ මුල් ගෝලයන් දෙදෙනා වූහ.

මොවුන් දෙදෙනා අතුරෙන් කෙනෙකුගේ නම අන්ද්‍රෘය. ඔහු තමාගේ සහෝදරයා වූ සීමොන් හමුවීමට ගොස් එම ශුභාරංචිය, එනම් "අපට ක්‍රිස්තුස්වහන්සේ හමුවූසේක" යන පුවත කීවේය. ඉන්පසු ඔහු තම සොහොයුරා යේසුස්වහන්සේ වෙතට කැඳවාගෙන ගියේය. උන්-වහන්සේද ඔහුට කථාකොට; "එසේය; ඔබ සිමියොන්ය නමුත් මෙතැන් සිට පර්වතය යන අර්ථය ඇති පේත්‍රුස් යන නම තබන්නෙමි"යි කීසේක. පේත්‍රුස් කැඳවනු ලැබූ තුන්වන ගෝලයා විය.

ඊළඟ දවසේදී, යේසුස්වහන්සේ ගලීලයට ගිය විට එහිදී පිලිප් හමුව "මා අනුව වරෙන්නැ"යි ඔහුට කීසේක. සිව්වන ගෝලයාවූ පිලිප්ද උන්වහන්සේ අනුව ගියේය. පිලිප්, පිටත්ව ගොස් නතානියෙල් සොයාගෙන, ඔහුටද "අපට ක්‍රිස්තුස්වහන්සේ හමුවූසේක. ඔබද විත් බලාගන්නැ"යි කීවේය. ඔවුන් තමන්වහන්සේ වෙතට එනු දුටු උන්වහන්සේ, "මෙන්න; විශ්වාසවන්ත තැනැත්තෙක් එන්නේය"යි කීසේක.

එයින් මවිතයට පත් නතානියෙල් කථාකොට; "ස්වාමින්වහන්ස, මා කෙබඳු කෙනෙක්ද යන්න ඔබ වහන්සේ කෙසේ දැනගත්සේක්දැ"යි මවිතයෙන් යුතුව විචාළේය. උන්වහන්සේ පිළිතුරු දෙමින් "ඔබ පිලිප්ට හමුවීමට පෙරත් මම දුටුවෙමි"යි කීසේක. උන්වහන්සේ අනුව ගමන්කළ පස්වන ගෝලයා වූ නතානියෙල්; සැබවින්ම ඔබවහන්සේ දෙවියන්වහන්සේගේ

පුත්‍රයාණෝය. ඉශ්‍රායෙල්වරුන්ගේ රජු වනසේකැයි කීවේය.

එතැන් සිට යේසුස්වහන්සේ මුළු පලාත පුරා ඇවිදිමින් දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ රාජ්‍යය පිළිබඳව මනුෂ්‍යයන්ට දේශනාකළසේක. ඒ සමගම උන්වහන්සේ මහත් සුවකිරීමේ ආශ්චර්යයන් වැලක්ම කළසේක. නොයෙක් ආකාර රෝගපීඩාවන්ගෙන් පෙලුණු බොහෝදෙනා උන්වහන්සේ වෙතට පැමිණ සියල්ලෝම සුවය ලැබුවෝය. උන්වහන්සේගේ නාමය ස්වල්ප කාලයක් තුලදී මහත් කීර්තියට පත් හෙයින් බොහෝදෙනා උන්වහන්සේ අනුව ගොස් ගෝලයන් වෙන්ට සෙවූහ. මේ සියල්ලන් අතුරෙන්, කලින් තෝරාගත්තවුන් සමඟ සියල්ලන් දොළොස්දෙනෙක් ගෝලයන් වූවෝය.

## අලුත් උත්පාදය

දවසක්ද, රාත්‍රියේ නිකදේමුස් නම් මනුෂ්‍යයෙක් යේසුස්වහන්සේ හමුවන්ට රහසිගතව පැමිණියේය. ඔහු යුදෙව්වන්ගේ ආගමේ නායකයෙකු වශයෙන් ප්‍රසිද්ධවූ බලවත්ත මනුෂ්‍යයෙක් විය.

ඔහු යේසුස්වහන්සේ අමතා; "මහතාණනි! ඔබ දෙවියන්වහන්සේ විසින් එවන ලද ගුරුවරයකු බව දනිමි. ඔබ මේ කරන්නාවූ ආශ්චර්යය ක්‍රියාවන්ගෙන්ද ඒබව ඔප්පු වන්නේය. මම ඔබවහන්සේගේ ගෝලයකු වන්නට කැමැත්තෙමි"යි කීවේය.

"ඔබ මුලින්ම නැවත උත්පාදය ලැබිය යුතුය"යි උන්වහන්සේ පිළිතුරු දුන්සේක.

"නැවත උත්පාදය! මම දැනටමත් වැඩුනාවූ මනුෂ්‍යයෙක්; මේ දේ සිදුවෙන්ට පුළුවන් කොහොමද"යි ඇසීය.

එවිට යේසුස්වහන්සේ පිළිතුරු දෙමින් "ඔබ කීවේ සැබෑව! නමුත් ඔබ දෙවියන්වහන්සේගේ ආත්මය කරණ-

කොටගෙන නැවත නූපන්නොත් ඔබට ස්වර්ග රාජ්‍යයට ඇතුල්වන්නට බැරිය"යි වදාළසේක. "ඔබ ළදරුවකු මෙන් උපන්කළ ඔබ මනුෂ්‍ය ජීවිතයකට උරුමක්කාරයෙක් විය. නමුත් ඔබට ස්වර්ගීය ජීවිතයක් ප්‍රදානය කළහැක්කේ ශුද්ධාත්මයාණන්වහන්සේට පමණකි". තවද "ස්වර්ගීය ජීවිතයක් නැතිව ස්වර්ගයෙහි ජීවත්විය නොහැක. එබැවින් මා ඔබට නැවත උත්පාදය ලැබිය යුතුයැයි කීවාට මවිත නොවන්නැ"යි කීසේක.

"ඔබ කුමක් අදහස් කරණසේක්දැයි මට නොතේරේ"යි නිකදේමුස් පිළිතුරු දුන්විට උන්වහන්සේ කථාකරමින්:

ඔබ යුදෙව්වන්ගේ ගුරුවරයෙකු නොවන්නේද? එසේනම් මේ දේ නොදන සිටින්නේ කෙසේද? මම ඔබට සැබෑව කියමි. මම ස්වර්ගයෙන් පැමිණි බැවින් මම ස්වර්ගය හඳුනමි. මා කෙරෙහි අදහාගන්නා කවරෙක් වුවත් හෙතෙම ආත්මයාණන්වහන්සේ තුලින් නැවත උත්පාදය ලැබුවේය. දෙවියන්වහන්සේ ලෝකයට කොතරම් ප්‍රේමකළසේක්ද යත්, උන්වහන්සේගේ එකම පුත්‍රයාණන් පවා එවූසේක. එබැවින් මට එම අලුත් ජීවිතය මා කෙරෙහි අදහාගන්නවුන්ට ප්‍රදානය කළහැක. දෙවියන්වහන්සේ දවසක මේ ලෝකය දුෂ්ටකමෙන් පිරී ඇතිබැවින් එය විනාශකර දමනසේක. එසේ කිරීමෙන් මා කෙරෙහි අදහා නොගන්නා සියල්ලෝම මරණය භුක්ති විඳින්නෝය. උන්වහන්සේ දූන් මා මේ ලෝකයට එවා වදාළේ විනිශ්චය කරන්ට නොව ගලවාගන්ටය. මා කෙරෙහි අදහාගන්නා සියල්ලන්ට මම සදාකාල ජීවනය දෙන්නෙමි. කවරක් සිදුවුවත් ඔවුන් හෙළාදකිනු නොලබන්නේය. මා කෙරෙහි අදහාගන්නා තැනැත්තේ මේ ලෝකයෙන් ගිය විටදී, මා සමඟ සදාකාලයටම ස්වර්ගරාජ්‍යයෙහි ජීවත්වන්නේය"යි කීසේක.

යේසුස්වහන්සේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නාට අද වුවත් සදාකාල ජීවනය ප්‍රදානය කරනසේක. ස්වර්ගරාජ්‍යයෙහිදී සදාකාල ජීවනය ඇතිව සිටීම පිණිස අප උන්වහන්සේ කෙරෙහි අදහාගත යුතුය. එසේ අදහාගත්තෝ කිසිකලෙක විනාශනොවන්නෝය.

## ළිඳ ළඟ සිටි ස්ත්‍රිය

යේසුස්වහන්සේ දවසක්දා සමාරියට වැඩියසේක. සමාරිතයෝ යුදෙව්වන් පිළිකුල් කළෝය. එසේම යුදෙව්වෝ සමාරිතයන් පිළිකුල් කළෝය. යුදෙව්වෙක් සමාරිතයට යාමට පවා නොකැමැති විය. යුදෙව්වෙක්වත් සමාරිතයෙක්වත් එකිනෙකාට කථාකිරීම පවා නොකළහ.

යේසුස්වහන්සේ යුදෙව්වෙක් වුවද උන්වහන්සේ සියල්ලන්ට එකසේ ප්‍රේමකළසේක. උන්වහන්සේ යුදෙව්වෙක් කෙරෙහි ඇති ප්‍රේමයේත් සමාරිතයෙක් කෙරෙහි ඇති ප්‍රේමයේත් වෙනසක් නොවීය. උන්වහන්සේ ජාතිය නොබලා සියලු මනුෂ්‍යයන්ට ප්‍රේමකළසේක. උන්වහන්සේ සමාරියට වැඩියේ බලාපොරොත්තුවක් ඇතිවය. ඔවුන්ටත් ගැළවුම්කරුවකු අවශ්‍ය බව උන්වහන්සේ දැනසිටිසේක. සමාරියෙහි යාකොබ්ගේ ළිඳ වෙතට උන්වහන්සේ පැමිණෙන විට දවසේ මධ්‍යහ්න කාලයවී තිබුණි. උන්වහන්සේ දැඩි අව්වේ ගමන් කොට විඩාවටපත්ව සිටිසේක. උන්වහන්සේ ළිඳ අසල වාඩිවී විඩාහරිමින් සිටින අතර උන්වහන්සේගේ ගෝලයෝ ආහාර යමක් මිළදී ගැනීමට නගරයට ගොස් සිටියෝය.

ටික වේලාවකින් සමාරිය ස්ත්‍රියක් වතුර ගෙනයාම පිණිස ළිඳ වෙතට ආවාය. යේසුස්වහන්සේ ඈට කථාකොට, "බීමට වතුර ටිකක් දෙන්න"යි ඉල්ලා සිටිසේක.

එයින් ඈ මවිතයට පත්වූවාය. "ඔබවහන්සේ යුදෙව්වෙකි.

මම වනාහි සමාරිය ස්ත්‍රියෙකැ"යි ඕ කීවාය. ඊට පිළිතුරු දුන් උන්වහන්සේ; "නුමුත් ඔබට දෙවියන්වහන්සේ මොනතරම් උතුම් දීමනාවක් දී තිබේදැයි යන්නත්, කථාකරන මා කවුරුන්දැයි යන්නත් දැනසිටියානම්, මගෙන් 'ජීවනයේ වතුර' ඉල්ලනවා ඇතැ"යි කීසේක. ඈ මේ කීම තේරුම් නොගත්තාය. "ළිඳ බොහෝ ගැඹුරුය. ඔබ ළඟ ලනුවක්වත් භාජනයක්වත් නැත. එසේ තිබියදී ඔබ මේ කියන ජීවනයේ වතුර ගන්නේ කෙසේදැ"යි උන්වහන්සේගෙන් ඇසුවාය.

යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්; "මේ ළිඳෙන් වතුර බොන ඔබට නැවත නැවතත් පිපාසය වන්නේය. නමුත් මා ඔබට දෙන්ට සූදානම් කොට ඇති ජලය නොපෙනේ. එය දෙවියන්වහන්සේ වෙතින් පැමිණෙන සදාකාල ජීවනයයි" කීසේක.

"දයාබර ස්වාමිනි! මට ඒ වතුර බොන්ට දුන මැනවි. එවිට මට පිපාස නොවන්නේය. දිනපතා මෙතරම් දුර පිහිටි මේ ළිඳට ගමන්කරන්ටද නොවන්නේයයි" උදක්ම ඉල්ලා සිටියාය.

මේ ස්ත්‍රී අපවිත්‍ර ජීවිතයක් ඇති තැනැත්තියකි. ඈ කරන පාපය යේසුස්වහන්සේ දනිතැයි ඈ නොසිතුවාය. නමුත් උන්වහන්සේ සියල්ල දැනසිටිසේක. අපද, කරන කියන සියල්ල උන්වහන්සේ දන්නාසේක. උන්වහන්සේ ඇට ඒබව කීසේක.

ඈ ඉතා පුදුමයට පත්ව; "ස්වාමිනි! ඔබවහන්සේ දෙවියන්වහන්සේ වෙතින් ආ දූතයෙකි. නමස්කාර කිරීම පිණිස ඉතාම යෝග්‍ය ස්ථානය කොතැනදැ'යි කිව මැනව"යි ඉල්ලා සිටියාය. යේසුස්වහන්සේද "දෙවියන්වහන්සේ මනුෂ්‍යයකුවත්, එක්තැනක සිටින්නාවූ අප්‍රාණික දේවරූපයක්වත් නොවේ. උන්වහන්සේ ආත්මයෙකි. උන්වහන්සේට ආත්මයෙන් නමස්කාර කළයුතුය. එබැවින්

වැදගත්වන්නේ යාච්ඤාකරන ආකල්පය මිස ස්ථානය නොවේ. තවද සැබෑලෙසත් ආත්මයෙන් යුතුවත් යාච්ඤාකරනු පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේ එවිට මගපෙන්වනසේක. උන්වහන්සේ අපවෙතට පැමිණ අපගේ නමස්කාරය සැබෑ නමස්කාරයක් කරණු ඇත. දෙවියන්වහන්සේ අපගෙන් බලාපොරොත්තුවන නමස්-කාරය එබඳුය"යි කීසේක.

උන්වහන්සේ ජීවනයේ වතුර ගැන කථාකරනවිට එයින් නිතරම අදහස් කළේ ශුද්ධාත්මයාණන්වහන්සේය. එහෙත් ඇ මෙයින්ද සියල්ල වටහා නොගත්තාය. තවදුරට කථාකළ ඇ මෙසේද කීවාය. "යම් දවසක ක්‍රිස්තුස් නමින් ගැළවුම්කරුවාණන් පහළවන බව මම දැනසිටිමි. උන්වහන්සේ පැමිණි කළ මේ සියල්ල අපට වටහා දෙනවා ඇතැ"යි කීවාය.

යේසුස්වහන්සේද තමන් ක්‍රිස්තුස් බව ප්‍රකාශ කළසේක. මහත්සේ පුදුමයට පත් ඇ තවත් කිසිවක් නොකියා වතුර භාජනය ළිඳ ළඟම තබා, මේ ශුභාරංචිය ප්‍රකාශ කිරීම පිණිස නගරය වෙත දුවගොස් මිනිසුනට අඬගැසුවාය. මා ගැන සියල්ල කීවාවූ පුදුම මනුෂ්‍යයෙක් සිටියි. "එන්න! මා සමඟ ගොස් ඔහු මුණගැසී, එතුමාණන් ක්‍රිස්තුස් විය හැකිදැයි බලන්න"යි මිනිසුන් පෙළඹුවාය.

සෙනඟ ඇ සමඟ උන්වහන්සේ වෙතට ගොස්, යටහත් ලෙස උන්වහන්සේගෙන් ඔවුන් සමඟ නතර වන ලෙස උදක්ම ඉල්ලා සිටියෝය. දෙදිනක් උන්වහන්සේ ඔවුන් සමඟ නතරව සිටිමින් ඔවුන්ට බොහෝ කාරණා උගන්වා එතැනින් නික්ම ගියසේක. ඔව්හුද, එම ස්ත්‍රීට කථාකොට, "පළමුකොට ඔබ කී බැවින් අදහා ගතිමු. නමුත් දැන් අපි උන්වහන්සේ ලෝකයේ ගැළවුම්කාරයාණන්වහන්සේ බව ස්ථිරවම අදහාගනිමු"යි කීවෝය.

## යේසුස්වහන්සේ ලාදුරු රෝගියෙකු සුවපත්කිරීම

දවසක්ද, බලවත්ලෙස ලාදුරු රෝගයෙන් පීඩාවිඳි මනුෂ්‍යයෙක් යේසුස්වහන්සේ වෙතට පැමිණ, මුණින් වැටී නමස්කාර කොට "ස්වාමීන්වහන්ස! මා සුවපත් කරණසේක්වා"යි ඉල්ලා සිටියේය.

ඔහු කථාකොට "ස්වාමිනී! ඔබවහන්සේ කැමතිසේක් නම් මා මේ භයානක රෝගයෙන් මුදා සුවපත් කරන්ට ඔබවහන්සේට පුළුවන් බව මම අදහමි"යි කියා සිටියේය.

උන්වහන්සේ එවිට ඔහු වෙතට ගොස් අත් තබා ඔහු සුවපත් කළසේක. අවුරුදු ගණනාවක් තිස්සේ කිසි මනුෂ්‍යයෙක් කවදාවත් ඔහුගේ ශරීරයට අතතබා නැත.

උන්වහන්සේ ඔහුට කථාකර "සැබවින්ම සුවපත් වෙයන්න"යි වදාළසේක.

මේ ආශ්චර්යය ක්‍රියාව පිළිබඳ පුවත වහාම පැතිර ගියේය. මේ නිසා බොහෝ දිශා වලින් මනුෂ්‍යයන් පැමිණ උන්වහන්සේට ඇහුම්කන් දෙමින් තම රෝගයන්ද සුවපත්කර ගත්තෝය.

## යේසුස්වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වූසේක

දවසක්ද, යේසුස්වහන්සේ කන්දක් පාමුලට ගොස්, වාඩිවී තමන් ගෝලයන් කැඳවා ඔවුන්ට ඉගැන්වූසේක්; "මම ඔබට සැබෑලෙසින්ම ප්‍රීතියෙන් සිටින්නෝ කවරහුදැයි කියමි"යි කීසේක. ඔවුන් නම්:

'යටහත් සිතක් ඇතිව සතුටින් සිටින්නෝ ස්වර්ගරාජ්‍යට ඇතුලුවන්නෝය'.

'තමන්ගේ පව්ගැන තැවෙන්නෝ සතුටට පත්වන්නෝය, මක්නිසාද ඔව්හු සනසනු ලබන්නෝය'.

'යමෙක් උඩඟු නොවන්නේනම් ඔවුන් සතුටු වන්නෝය. මක්නිසාද මුළු ලෝකය ඔවුන් සතුය'.

'යමෙක් යහපත කිරීමට ඇලුම්වේද ඔව්හු සතුටු වන්නෝය. මක්නිසාද ඔව්හු යහපත්කොට ගණන්ගනු ලබන්නෝය'.

'යමෙක් කරුණාවන්තද, සමාවන සුළුද, ඔවුන් සතුටුවන්නෝය. මක්නිසාද ඔවුන් කරුණාව ලබා තමන් වරද ක්ෂමාකරනු ලබන්නෝය'.

'යමෙක් පවිත්‍ර ජීවිත ඇත්තෝද ඔවුන් සතුටු වන්නෝය. මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේ දකින්නෝය'.

'යමෙක් සමාදනය සොයන්නෝද, ඔව්හු සතුටු වන්නෝය. මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ දරුවන්යැයි කියනු ලැබේ'.

'යමෙක් තමාගේ යහපත් ක්‍රියා නිසා පීඩා විඳින්නෝද ඔවුන් සතුටු වන්නෝය. මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය ඔවුන්හට වන්නේය.

සැබවක් ඔබට කියමි. යමෙක් මාගේ නාමය නිසා පීඩා කරනු ලබන්නෝද? ඔව්හු මාගේ මිත්‍රයන් වන්නෝය. මේ නිසා ඔබ පීඩා විඳින්නහු නම් ස්වර්ගයෙහිදී ඔබට බොහෝ වස්තුව රැස්වන්නේය. ආහාරය ලුණු වලින් රසවත් වන්නාක්මෙන් එම පීඩා ඔබගේ සතුට පිණිස වන්නේය.

සැබවින්ම ඔබ නොමැති නම් ලෝකය දුක් සහිත තැනක් වන්නේය. ඔබ කඳු මුඳුනක දල්වෙන පහනක් බඳුය. එයින් මඟ යන සියල්ලන්ට ආලෝකය ලැබේ. ඔබ ඒ පහන නොසැඟවිය යුතුය. එහි ආලෝකය වන ඔබගේ යහපත් ජීවිත දකීමෙන් මනුෂ්‍යයෝ ඔබ දෙවියන්වහන්සේගේ දරුවන් බව දනගන්නෝය. එසේ ඔව්හු දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්නෝය.

මා අනුව එන්ට කැමති යමෙක් වෙත්නම් ඔවුන් මට කීකරු විය යුතුය. දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීමට ඇති එකම මාර්ගය එයවෙයි. ඔබගේම නිවෙස් තුළ වුවත් සිටින

එකිනෙකාට සාපකිරීමෙන්ද කෝප ඉපදවීමෙන්ද වැළකී සිටිය යුතුයි.

ඔබත් ඔබේ අසල්වැසියාත් අතර පවත්නා අසමගිතාවයන් දෙවියන්වහන්සේට යාච්ඤා කිරීමට පෙර පහකර ගතයුතුයි. පාපයෙන් යුත් හදවත් තුලින් කරණ යාච්ඤා දෙවියන්වහන්සේ ඇහුම්කන් නොදෙනසේක.

ඔබට වරද කළවුන්ට කමාකළ යුතුය. ඔබගේ අසල්වැසියා රිදවීමට ඔබකළ යමක් ඇද්ද ඒ ගැන ඔබේ කණගාටුව ඔහුට කියා සිටිය යුතුය.

යමෙක් ඔබට රිදවුවොත් පලිගැනීමක් වශයෙන් ඔහුට නොරිදවන්න. ඔවුන් ඔබට අකරුණාවන්ත වූවොත් ප්‍රතික්‍රියා වශයෙන් ඔබද අකරුණාවන්ත නොවන්න. ඔබ සතු දේ ආත්මාර්ථකාමී ලෙස ප්‍රයෝජනයට නොගන්න. ඒවා අන්‍යයන් අතරේද බෙදාගෙන ප්‍රයෝජනයට ගන්න සිතාගත යුතුය. ඔබේ උපකාරය අවශ්‍ය වන්නන්ට එය ලබාදෙන්න.

සමහරු තමාගේ මිත්‍රයාට ප්‍රේමකරන්ටත් සතුරාට වෛරකරන්ටත් උගන්වති. නමුත් මම ඔබට කියමි. ඔබේ සතුරන්ට ප්‍රේමකරන්න. ඔබට වෛරකරන්නන් වෙනුවෙන් යාච්ඤා කරන්න. මෙසේ කිරීමෙන් ඔබ දෙවියන්-වහන්සේගේ සැබෑ දරුවන් මෙන් ක්‍රියා කරන්නහුය. උන්වහන්සේ එසේ ක්‍රියා කරනසේක. උන්වහන්සේගේ දරුවන්ද එසේ ක්‍රියා කරනු දැක්ම උන්වහන්සේගේ පරමාර්ථයයි.

ඔබ උන්වහන්සේගේ නාමයෙන් මේ දේවල් කරන්නහු නම් ඔබ දෙවියන්වහන්සේ ප්‍රසන්න කරන්නෙහිය. නමුත් පෙනීමට පමණක් යහපත් ක්‍රියා නොකෙරේවා.

වෙන අය ඔබ යහපත් ක්‍රියා කරන බව දකින පිණිස එසේ

නොකළ යුතුය. දෙවියන්වහන්සේට ඔබේ සිත දකින්ට පුළුවන් බව සිතේ තබාගත යුතුය. වෙන කිසිවෙක් දැනගන්ට පළමුවෙන් උන්වහන්සේ ඔබේ ක්‍රියාවන් දැක ඔබට ප්‍රතිවිපාක දෙනසේක.

## යාච්ඤා කළයුත්තේ කෙසේද?

දේවස්ථානවලදීත් වෙනත් ප්‍රසිද්ධ තැන් වලදීත් පමණක් යාච්ඤා කරන මනුෂ්‍යයෝ සිටිති. ඔවුන් යහපත් අය මෙන් අනුන් දකිනවාට කැමැත්තෝය. ඔවුන්ට මනුෂ්‍යයන් රවටන්ට හැකිවුවද දෙවියන්වහන්සේ රවටන්ට නොහැකිය.

ඔබ යාච්ඤා කරන කළ රහස් ස්ථානයකට ගොස් දොර වසාගෙන තනිව සිට යාච්ඤා කරන්න. අන්‍යයන් ඔබ යාච්ඤා කරන බව නොදනිතත් රහසින් දකින දෙවියන්වහන්සේ විපාක දෙනසේක.

එකම යාච්ඤාව දිගින් දිගටම කියාගෙන නොයන්න. එකම යාච්ඤාව නැවත නැවත කියාගෙන යාමෙන් දෙවියන්වහන්සේ ප්‍රසන්න කරන්ට හැකිවේ යැයි සමහරු සිතති. දෙවියන්වහන්සේ ඔබගේ පියාණන්වහන්සේය. ඔබ ඉල්ලන්ට පළමුවෙන් ඔබට අවශ්‍ය කුමක්දැයි උන්වහන්සේ දන්නාසේක.

මෙලෙස යාච්ඤා කරන්න. "ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබගේ ශුද්ධ නාමයට ගෞරවවේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරණු ලැබේවා. අපගේ දිනපතා භෝජනය අපට අද දුනමැනව. අපට වරද කළ අයට අප කමාවූවාක් මෙන් අපේ වැරදි වලටත් කමාවූව මැනව. අප පරීක්ෂාවට නොපමුණුවා නපුරෙන් අප ගලවාගත මැනව, ආමෙන්".

ඔබට වැරදි කරන අයට ඔබ කමාවන්නහු නම් ස්වර්ගයේ සිටින ඔබගේ පියාණන්වහන්සේත් ඔබට

කමාකරනසේක. නමුත් ඔබ ඔවුන්ට ක්ෂමා නොකරනවා නම් උන්වහන්සේත් ඔබට ක්ෂමා නොකරනසේක.

## දෙවියන්වහන්සේ ඔබව රැකබලා ගන්නාසේක

"ඔබගේ ජීවිතය මුදල් ඉපදවීමට නොයොදවන්න. මුදල් නැතිවන්ටත් හොරු පැහැර ගන්ටත් පුළුවන. නමුත් ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේ සතුටු කිරීම පිණිස යොදවන්න. එසේ කිරීමෙන් ඔබ ස්වර්ගයෙහි නැති නොවන සොරු නොගන්නා වස්තුව රැස්කරන්න. මිනිස්සු තම ජීවිතය වටිනා දෙයහි යොදවන්ට ප්‍රිය කරති. එබැවින් ඔබත් ඔබේ ජීවිතය යහපත් දේ පිණිස යොදවන්න. ඔබට ඔබේ ජීවිතය දෙවියන්වහන්සේටත් මුදලටත් යන දෙකටම යොදවන්ට පුළුවන්කමක් නැත. ඔබ මේ දෙකෙන් එකක් තෝරාගත යුතුය.

"මම ඔබට මෙසේද කියමි. මුදල් හෝ ආහාරපානාදිය හෝ ඇඳුම් පැළඳුම් ගැන හෝ ආලය නොවන්න. දෙවියන්වහන්සේ ඔබට ශරීරයත් ජීවිතයත් ප්‍රදානය කොට ඇත. ඔබ රැකබලා ගැනීම පිණිසත් උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්න. ඔබ; උන්වහන්සේට කුරුල්ලන්ට වඩා වටී. ඒනිසා කුමක් කන්නේද කියා කෑම ගැන කරදර නොවන්න. කුරුල්ලෝ තමන් ආහාරය ගැන නොවෙහෙසෙති. එහෙත් දෙවියන්වහන්සේ ඔවුන් පෝෂණය කරනසේක. මල් ඒවායේ අලංකාර ආයිත්තම ගැන කරදර නොවෙති. එහෙත් දෙවියන්වහන්සේ ඔවුන් අලංකාර ඇඳුමෙන් සරසනසේක. එතරම් කෙටිකලක් පවතින මල් උන්වහන්සේ ඒ තරම් අලංකාර ලෙස සරසනසේක් නම් ඔබ ඊට කොපමණ වැඩියෙන් අලංකාර නොකරනසේක්ද? එබැවින් කුමක් අඳිමුද කියා ඇඳුම් ගැන කරදර නොවන්න.

ඔබ ඔබේ ජීවිතය උන්වහන්සේ ප්‍රසන්න කිරීමට යොදවන්නේ නම් ඔබට ඕනෑකරන කෑම හා ඇඳුම් සියල්ල උන්වහන්සේ ලබා දෙනසේක. ඔබට උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය හැකිය. එබැවින් අනාගතය ගැන සිතා කරදර නොවන්න. දෙවියන්වහන්සේ අනාගතයේදීද ඔබ අරක්ෂා කරනසේක.

දෙවියන්වහන්සේ ඔබගේ ස්වර්ගීය පියාණෝය. උන්වහන්සේ ඔබට කෙතරම් ප්‍රේමකරනවාදයත් ඔබට අවශ්‍ය දේ උන්වහන්සේ සැබවින්ම දන්නාසේක. යාච්ඤාවෙන් උන්වහන්සේට කථාකරන්න. උන්වහන්සේ ඔබට අවශ්‍ය දේ දෙනසේක. ලෝකයේ පියවරු තම දරුවන්ට යහපත්දේ දෙත්නම් ස්වර්ගයේ සිටින පියාණන්වහන්සේ ඊට කොපමණ වැඩියෙන් නොදෙන සේක්ද?

## දෙවියන්වහන්සේට කීකරුවන්න

"ස්වර්ගය වෙත යන මාර්ගය ඉතා දුෂ්කරය. දොරටුවද ඉතා පටුය. එය හමුවන්නේ ස්වල්ප දෙනෙකුටය. විනාශයට යන පාර විශාලය. දොරටුවද පළල්ය. බොහෝ සමූහයා ඒ පහසු මාර්ගය තෝරා ගනිති. බොහෝදෙනා ස්වර්ගයට වෙනත් මර්ග වලින් යන්ට සොයති. නමුත් එය කළ නොහැකිවෙයි. ස්වර්ගයට ඇත්තේ, දෙවියන්වහන්සේට කීකරුකමෙන් යායුතු පටු මාර්ගය පමණය. බොහෝ සෙනඟ තමන් ක්‍රිස්තියානිකාරයන් යයි කියාගනිති. ඔව්හු; මා අනුව යන්නෝයයි කියති. නුමුත් මට කීකරු නොවෙති. ඔව්හු මාගේ කැමැත්ත ඉටු නොකරති. එබැවින් ඔවුන් ස්වර්ගීය පටු මාර්ගයේ ගමන් නොයති. ඔවුන් සියල්ලෝම වඩා පහසු පළල් මාවතේ ගොස් විනාශයේ දොරටුවෙන් ඇතුල්ව සදාකාල ගින්නෙහි දුක් විඳිති.

යමෙක් මාගේ සැබෑ අනුගාමිකයෙක් නම් ඔහුගේ ක්‍රියාවන්ගෙන් ඒ බව ප්‍රකාශවිය යුතුය. තමාම ක්‍රිස්තියානිකාරයෙකැයි කියාගත් පමණින්ම විශ්වාස නොකරන්න. ඔහු ක්‍රියාවෙන්ද ක්‍රිස්තියානිකාරයෙකු විය යුතුයි. යමෙක් මාගේ වචන අසා ඒවා පවත්වන්නේද ඔහු පර්වතය පිට තම ගෙය ගොඩනගාගත් ඥානවන්ත මනුෂ්‍යයෙකුට සමානවන්නේය.

නමුත් යමෙක් මාගේ වචන අසා ඒවා නොපිළිපදින්නේද ඔහු, වැල්ලේ තමාගේ ගෙය සාදගත් අඥානවන්තයෙකුට සමානය. කුණාටුව හමා ගියකල ඔහු සාදගත් ගෙය කඩාවැටී විනාශවන්නේය. ජලගැලීමෙන් එය යටව ගසාගෙන යන්නේය".

මනුෂ්‍යයෝ උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන මවිත වූවෝය. මක්නිසාද උන්වහන්සේ තමන් කථාකරන සියල්ල හරිහැටි දනගෙන කථාකරන බව ඔවුන්ට පෙනීගියේය. මේ ඉගැන්වීම් ඔවුන්ගේ ආගමික ගුරුවරුන්ගේ ඉගැන්වීම් වලට වඩා බෙහෙවින් බලවන්ත විය.

## කුඩා ගැහැණු දරුවෙක් මළවුන්ගෙන් නැගිටුණාය

දවසක්ද යායිරස් නම්ලත් යුදෙව් ගුරුවරයෙක් යේසුස්වහන්සේ හමුවීමට දුවගෙන ආවේය. ඔහු යේසුස්වහන්සේ දුටුවිට දෙපා ළඟ දණින් වැටී ඔහුගේ ගෙදරට එනලෙස උන්වහන්සේගෙන් බැගෑපත්ව ඉල්ලා සිටියේය. "මාගේ දුව නසින්ට යනවා; ඇගේ වයස අවුරුදු දොළහයි. මට සිටින එකම ගැහැණු දරුවා ඈ පමණයි" කියමින් අඬා වැළපුණේය. "ඔබවහන්සේ පැමිණ ඈ සුවකළ මැනවයි"ද කියා සිටියේය.

උන්වහන්සේ යායිරස් සමඟ යාමට පිටත්වූ නමුදු නෙරපී සිටින සෙනග නිසා උන්වහන්සේගේ ගමනට බාධාවිය.

සමූහයා අතර දුප්පත් ස්ත්‍රියක් වූවාය. ඈ බොහෝසෙයින් රෝගීව සිටියාය. ඈ බොහෝ වෛද්‍යවරුන්ගේ පිහිට සෙවූ නමුත් එයින් කිසි යහපතක් නොවීය. ඈ අවුරුදු දොළසක්ම රෝගීව සිටියාය. ඈ තමාගේ රෝගය ගැන යේසුස්වහන්සේට කියන්ට ලැජ්ජා වූවාය. සෙනඟ අතරේ අමාරුවෙන් උන්වහන්සේට ළංවූ ඈ හයෙන් උන්-වහන්සේගේ සළුවේ කෙළවරට අත තැබුවාය. ඒ මොහොතේම ඈ සුවය ලැබුවාය.

උන්වහන්සේ නතරව හැරී බලා "මට අත තැබුවේ කවුරුද"යි ඇසුසේක. පේත්‍රුස් පිළිතුරු දෙමින් "ස්වාමිනි! බොහෝ සෙනඟ මෙහි ඇත. ඔවුන් ඔබවහන්සේට තෙරපෙමින් සිටිති"යි කීවේය.

"නමුත් යම්කෙනෙක් උවමනාවෙන්ම මට අතතැබූ නිසා මගෙන් බලය නික්මුණ බව දැණුනේය"යි කීසේක. ඒ ඇසූ සුවය ලැබූ ස්ත්‍රිය, උන්වහන්සේ වෙතට හයේ වෙවුලමින් පැමිණ නමස්කාර කර ඈ සුවවීම පිළිබඳ මුළු පුවත ප්‍රකාශකර සිටියාය. ඈට උත්තර දුන් යේසුස්වහන්සේ; "දියණියනි! ඔබ මා කෙරෙහි ඇති ඇදහිල්ල කරණකොටගෙන ඔබ සුවය ලැබුවේය. සමාදානයෙන් යන්න"යි ඈට කීසේක.

උන්වහන්සේ ඈට කථාකරමින් සිටියදීම සේවකයෙක් පැමිණ යායිරස්ට කථාකර; "බොහෝ ප්‍රමාදවූවා වැඩිය. ඔබේ දුව මළාය. ස්වාමීන්වහන්සේට තවදුරටත් කරදර නොකරන්න"යි කීවේය. නමුත් යේසුස්වහන්සේට මෙය ඇසුණු විට "හයනොවන්න, මා කෙරෙහි විශ්වාසය තබාගෙන සිටින්න, ඈ සුවවන්නීය"යි කීසේක.

පිරිස උන්වහන්සේ සමඟ යායිරස්ගේ ගෙදරට යනවිට, එහි සෙනඟ පිරී භූමදාන කටයුතු සූදානම් කරමින් තිබුණි. එහි වැළපීම කොතරම්ද යත් යේසුස්වහන්සේ ඔවුන්ට

කථාකොට, "දුක්නොවන්න, ඈ මැරිලා නැත. නිදාගෙන සිටින්නීය"යි කීසේක.

එහි සිටි අය උන්වහන්සේගේ කීම ගැන සිනාසුණෝය. ඔව්හු ඈ මළබව හොඳින්ම දැනසිටියහ. එහෙත් ඔව්හු යේසුස්වහන්සේට මළකෙනෙකු ජීවත් කරවීම, අපට නිදා සිටින කෙනෙකු අවදිකරවීම තරම් පහසු දෙයක් බව නොදැන සිටියහ. එසේ වන්නේ ජීවිතදානය කළ හැකි තැනැත්තේ උන්වහන්සේ වන බැවිනි. උන්වහන්සේට නිදා සිටීමත් මරණයත් එකසේය.

උන්වහන්සේ, පේත්‍රුස්ද, අන්ද්‍රෑද, යොහන්ද, ඇගේ දෙමව්පියන්ද හැර අන් සියල්ලන් කාමරයෙන් පිටකළසේක. ඉන්පසු උන්වහන්සේ දැරියගේ අතින් අල්ලා "දරුව! නැගිටින්න"යි කීසේක. ඒ මොහොතේම ඈ ඇස්හැර සම්පූර්ණ සුවයද ඇතිව නැගිට සිටියාය.

යේසුස්වහන්සේ දෙමව්පියන් දෙසට හැරී "ඇට යමක් කන්ට දෙන්ට"යි වදාළසේක. සියල්ලෝම මහත්සේ ප්‍රීතියටත් පුදුමයටත් පත්වූහ.

මළවුන්ට පවා පණ දීමට හැකි උන්වහන්සේට වෙන කළ නොහැකි දෙයක් නැත.

## පන්දහසකට කන්ට දුන්සේක

දහස්ගණන් මනුෂ්‍යයෝ උන්වහන්සේ රෝගීන් සුවකරනු දකින්ට උන්වහන්සේ පිටුපස ගියෝය. දවසක් උන්වහන්සේ ඔරුවක නැගී ගලීලය මුහුදේ අනිත් වෙරළින් ගොඩවී කඳු බෑවුමේ නිශ්චල තැනක වාඩි වූසේක. උන්වහන්සේට තමන්වහන්සේගේ ගෝලයන් සමඟ විවේකව සිටින්ට අවශ්‍ය විය. නමුත් බොහෝ වේලා එසේ විවේකීව සිටින්නට අවකාශ ලැබුනේ නැත. සෙනඟ වෙරළ දෙසින් විත් උන්වහන්සේ අවට රැස්වන්ට විය. ඔව්හු පැය ගණනක්

ඇවිද බොහෝසේ විඩාවට සහ කුසගින්නට පත්ව සිටියෝය.

උන්වහන්සේ පිලිප් දෙසට හැරී, "මේ සෙනඟට කන්ට දෙන්ට ආහාර කොතැනින් මිලදී ගතහැකිද"යි විමසූසේක.

මේ වනවිටත් ඔවුන්ට මොන ආකාරයෙන් කෑම ලබා දෙනවාදැයි උන්වහන්සේ දැන සිටිසේක. නමුත් පිලිප් කුමක් කියනවා ඇත්දැයි ප්‍රකාශවන පිණිස උන්වහන්සේ එසේ ඇසූසේක. "එක්කෙනෙකුට කුඩා ආහාර කොටස බැගින්වත් දීමට විශාල මුදලක් අවශ්‍යවේ"යැයි පිලිප් පිළිතුරු දුන්නේය. එහි එතරම් ආහාර ලබාගැනීමට ගබඩා නුවූවාක් මෙන්ම එසේ තිබුණත් ඒවා මිලදී ගැනීමට ගෝලයන් අත තිබූ ඉතා සුළු මුදල ප්‍රමාණවත් නොවීය.

අන්ද්‍රෑ කථාකළේය. "මෙහි තමාගේ දහවල් ආහාරය පිණිස රොටී පහකුත් මසුන් දෙදෙනෙකුත් ගෙනැවිත් ඇති ළමයෙක් සිටියි. නමුත් එතරම් කුඩා ආහාර වේලක් මෙතරම් ලොකු සමූහයකට කෙසේ ප්‍රමාණවත්වේද"යි කීවේය.

එවිට යේසුස්වහන්සේ තමන් ගෝලයන්ට කථාකොට සෙනඟ වාඩි කරවන ලෙස නියෝග කළසේක. එම තණ ඇතිරිල්ලෙහි පන්දහසකට වැඩි සෙනඟක් වාඩිවූහ. නමුත් කිසිවෙක් උන්වහන්සේ කුමක් කරන්ට යනසේක්දැයි නොදැන සිටියහ.

උන්වහන්සේ ළමයා අත තිබූ රොටී පස සහ කුඩා මසුන් දෙදෙන අතට ගෙන, දෙවියන්වහන්සේට මේ ආහාරය ගැන ස්තුති කොට, ඒවා සෙනඟ අතර බෙදා දෙන පිණිස ගෝලයන් අතට දුන්සේක. ඒවා බෙදා දුන්විට සියල්ලන්ට බඩ පුරා කෑමට තරම් සෑහුණේය. යේසුස්වහන්සේ අතෙහි වූ රොටී පහක් සහ මසුන් දෙදෙනා පන්දහසකට කෑමට සෑහුණේය.

ඔවුන් සියල්ලන් කා තෘප්තියට පැමිණි පසු යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට "කිසිවක් ඉවත නොයනු පිණිස ගොස් ඉතිරි කෑම සියල්ල කුඩාවලට එකතුකරන්නයැ"යි නියෝග කළසේක. එසේ එකතුකළ කෑම කුඩා දොළොසක් පුරවා ගන්නා ලදී.

## කඳු මුදුනකදී

පන්දහසකට කන්ට දීමෙන් ස්වල්ප දිනකට පසු දවසක උන්වහන්සේ, පේත්‍රුස්, යාකොබ් සහ යොහන් යන ගෝලයන් තිදෙනාද කැඳවාගෙන කන්දක් මුදුනට ගියසේක. උන්වහන්සේ තනිව එම ගෝලයන් තිදෙනා සමඟ සිටින විට හදිසියේම උන්වහන්සේගේ මුහුණ සූර්යයාමෙන් බබළන්නට වූ අතර උන්වහන්සේගේ ඇඳුම් දිළිසෙන සුදෙන් බබළන්නට විය. ඒ සමඟම මෝසෙස්ද එළියාද එතැනට පැමිණ උන්වහන්සේ සමඟ කථාකරමින් සිටියෝය. එම උත්තම මනුෂ්‍යයන් දෙදෙනා අවුරුදු සිය ගණනකට පෙර මළ අය වූහ.

මේ දර්ශණයෙන් මහත්සේ මවිතයටත්, භයටත්, පත්වූ පේත්‍රුස් තමාට පැමිණි අදහස කියමින්, "ස්වාමිනි! ඔබවහන්සේට එකකුත්, මෝසෙස්ට එකකුත්, එළියාට එකකුත් යයි කුඩාරම් තුනක් මෙතැන සාදමුදැ"යි ඇසීය.

එහෙත් ඔවුන් කථාකරමින් සිටියදීම මහත් වළාකුළක් අහසින් පාත්ව ඔවුන් එයින් වසාගත් අතර එයින් හඬක් නික්මී, "මේ මාගේ ප්‍රිය පුත්‍රයාය. මුන්වහන්සේට ඇහුම්කන් දියයුතුයැ"යි කීවේය.

ඒ සමඟම වළාකුළ ඉවත්වූ කළ මෝසෙස්වත් එළියාවත් එහි නුවූ අතර යේසුස්වහන්සේ තනිව පෙරමෙන් ගෝලයන් සමඟ සිටිසේක. කන්දෙන් පහළට බැස්ස කළ උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටින තුරු මේ සිද්ධිය කාටවත් නොකියන

ලෙස නියෝග කළසේක. ගෝලයෝ “මළවුන්ගෙන් නැගිටින තෙක්” යන මේ කීමේ තේරුම කුමක්දැයි වරින් වර සිතුවෝය.

## යහපත් අසල්වැසියා

දවසක්ද, එක් මනුෂ්‍යයෙක් යේසුස්වහන්සේ වෙතට පැමිණ මෙසේ ඇසුවේය. “ආචාරීන්වහන්ස! කෙනෙක් සදාකාල ස්වර්ගරාජ්‍යය ලබාගැනීම පිණිස කුමක් කළයුතුද”යි ඇසුවේය.

මෝසෙස්ගේ ව්‍යවස්ථාව පිළිබඳව උගතෙකුවූ මේ මනුෂ්‍යයාගෙන් උන්වහන්සේ මෙසේ ඇසූසේක. “මේ ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙන්නේ කුමක්ද?”

ඔහුද පිළිතුරු දෙමින්, “තාගේ මුළු හෘදයෙන්ද, තාගේ මුළු බුද්ධියෙන්ද, තාගේ මුළු ශක්තියෙන්ද තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේමකරව, එලෙසම තාගේ අසල්වැසියාට තට මෙන්ම ප්‍රේමකරව”යයි කීවේය.

“ඔබ කීවා හරිය, ගොස් එසේ කරන්න. එවිට ඔබ ජීවත්වන්නෙහි”යයි කීසේක.

එහෙත් ඔහු සමහර මිනිසුනට ප්‍රේම නොකරන බැවින්, “ස්වාමිනි! මාගේ අසල්වැසියා කවරේද”යි ප්‍රශ්න කළේය. යේසුස්වහන්සේ කථාන්තරයක් කීමෙන් පිළිතුරු දුන්සේක.

එක් යුදෙව්වෙක්, යෙරුසලමේ සිට යෙරිකෝවට යන මාර්ගයේදී සොරු ඔහුට පහරදී, ඔහු සතුව තිබුණු මුදල් සහ ඇඳුම්ද කොල්ලකාගත්තෝය. ඉන්පසු තුවාල සිදුකොට පාර අයිනට ඇද දැමුවෝය. එසේ ඔහු මාරාන්තිකව සිහිනැතිව වැටී සිටියේය.

එවිට, ඒ අසලින් යුදෙව් පූජකයෙක් ගියේය. ඔහු වැටී සිටි තැනැත්තා දුටු නමුත් ඔහුට උපකාර නොවීය. ඔහු පාර හරහා අනිත් පැත්තෙන් තමාගේ ගමන යන්නට ගියේය.

මරණාසන්නව සිටි මනුෂ්‍යයෙකුට උපකාර වීමට ඔහුට අවශ්‍යකමක් නොවීය.

ඉන්පසු යුදෙව් ආගමේ ශුද්ධවරයෙක්ද එතැනින් ගියේය. ඔහුත් එම මරණාසන්න මනුෂ්‍යයාට උපකාරයක් වනවා වෙනුවට වහ වහා එතැනින් යන්ට ගියේය. සොරුන් සිටින එම මාර්ගයේදී කෙනෙකුට උපකාර වීමට ප්‍රමාදවීම අනතුරුදායකයැයි ඔහු සිතුවේය.

මින්පසු එතැනින් යාමට සමාරිතයෙක් පැමිණියේය. නමුත් යුදෙව්වෙකුට, කවර අවස්ථාවක සිටියත් උපකාර වීමට සමාරිතයෙක් ඉදිරිපත්වේද? යුදෙව්වෝ සමාරිතයන් හෙළාදකිති.

නමුත් මේ සමාරිතයා ඔහුගේ තත්වය ගැන අනුකම්පා කළේය. ඔහු එතැන නැවතී වැටී සිටි මනුෂ්‍යයාගේ තුවාලවලට බෙහෙත් දමා ඒවා රෙදිපටි වලින් වෙළීය. එසේ කොට ඔහු යුදෙව්වා ඔසවා තම කොටළුවා පිට තබාගෙන තමා පයින්ම තානායමක් වෙත ගියේය. ඉන්පසු මුළු රාත්‍රියම ඔහු එතැන නැවතී ඔහු රැකබලා ගත්තේය. පසුවද උදෑසන තානායම්කරුට මුදල්දී ඔහු සුව වෙනතුරු බලාගන්නා ලෙස කියා තව මුදල් අවශ්‍ය වෙතොත් ඔහුට දුන්වූ විට එය ගෙවන බවට පොරොන්දුවී එතැනින් ගියේය.

මෙසේ කියා යේසුස්වහන්සේ "මේ මනුෂ්‍යයන් තුන්දෙනා අතුරෙන් තුවාලලත් මනුෂ්‍යයාට අසල්වාසියා වූයේ කවරේදැ"යි ඇසූසේක.

ඒ තැනැත්තා පිළිතුරු දෙමින් "තමාට උපකාරවූ තැනැත්තේය"යි කීවේය.

එය හරි, "දැන් ඔබත් ගොස් එසේ කරන්නැ"යි කීසේක.

## යහපත් බැටළු එඬේරා

යේසුස්වහන්සේ උන්වහන්සේ උගන්වන දේ තෝරාදීම

පිණිස බොහෝවිට කථාන්තර කීසේක. මේත් එබඳු කථාන්තරයකි.

"යහපත් බැටළු එඬේරෙක් තමාගේ රැළ ඉතා ප්‍රවේශමෙන් බලාගන්නේය. රාත්‍රිකාලය වනවිට උස් බිත්ති සහිත කොටුවකට ඔවුන් රැස්කර කෑම දෙන්නේය. මේ නිසා, රාත්‍රිකාලයේදී බැටළුවන් අල්ලා ආහාර කොටගන්නා සතුන්ගෙන් ආරක්ෂාවෙති. රාත්‍රිකාලයේදී යමෙක් බිත්තියෙන් පැන කොටුවට ඇතුල්වේනම් ඔහු හොරෙකි. බැටළු එඬේරා ඇතුල්වන්නේ දොරටුවෙනි. බැටළුවන් ඇතුලත සිටියදී එඬේරා දොරටුවේ වාඩිවී සිටිමින් ඔවුන් රැකබලා ගනියි. ඔහුම දොරටුවයි.

ඔහු තමාගේ රැළේ බැටළුවන්ට එකිනෙකාගේ නමින් කථාකරයි. බැටළුවෝද ඔහුගේ හඬ අඳුනති. ගාලෙන් බැටළුවන් පිටතට ගන්නාවිට ඔහු ඔවුන් එළියට දක්කාගෙන රංචුව පෙරටුවෙන් තමා ගමන්කරයි. බැටළුවන් එඬේරගේ හඬ අඳුනන බැවින් ඔවුන් ඔහු අනුව යති. එඬේරා නොවන්නකු පසුපස උන් නොයති. මක්නිසාද එඬේරා නොවන්නාගේ හඬ ඔවුන් නොහඳුනන බැවින් ඔහු වෙතින් පළායති".

උන්වහන්සේ කිව් මේ කාරණය අසා සිටියවුන් තෙරුම් නොගත්තහුය. එබැවින් උන්වහන්සේ එය මෙසේ තෝරා දුන්සේක.

"මම එඬේරාවෙමි. සෙනඟ බැටළුවෝය. ඔව්හු මා අනුව යන්නෝය. යමෙක් මාගේ වචන අසා මා අනුව නොඑන්නෝද, ඔහු මගේ රැළට අයත් නොවේ. ඔවුන්ට දොරටුවෙන් ඇතුල්වෙන්ට නොහැකිවාක් මෙන් මා තුලින් මිස, ස්වර්ගරාජ්‍යයට ඇතුල්වන්ට නොහැක්කේය.

මා කෙරෙහි අදහාගන්නා තැනැත්තේ ගළවනු ලබන්නේය. කිසිවෙකුට වෙනත් මාර්ගයක් නැත්තේය.

සැබෑලෙස මා අනුව යන තැනැත්තේ වෙනත් ධර්මයක් උගන්වන ගුරුවරයෙකු පසුපස නොයන්නේය. එසේ අමුතු ධර්ම උගන්වන යමෙක් වෙත්ද ඔව්හු හොරුද කොල්ලකරුවෝද වෙති. ඔව්හු බොරු කියති. ඔවුන්ගේ බලාපොරොත්තුව වන්නේ කොල්ලකෑමත් මැරීමත්ය. මාගේ බලාපොරොත්තුව සදාකාල ජීවනය ලබාදීමය.

"මම යහපත් එඬේරාය. මාගේ සෙනඟ මාගේ බැටළුවෝය. යහපත් එඬේරා තම රැළ වෙනුවෙන් තමාගේ ප්‍රාණය පූජාකරන්නේය. මම මාගේ සෙනඟට ප්‍රේමකරන බැවින් කිසිදක අත්නොහරින්නෙමි. මම ඔවුන් සියලු නපුරෙන් ආරක්ෂාකර ගන්නෙමි. මා අනුව එන්නෝ මා හඳුනති. මම ඔවුන් හඳුනමි".

"මම මාගේ ජීවිතය ඔවුන් වෙනුවෙන් අත්හරින්නෙමි. මා ඉඩදුන්නොත් මිස කිසිවෙකුට මා මරණයට පත්කරන්නට නොහැක. මට මගේ ජීවිතය දෙන්ටත් එය ආපසු ගන්ටත් බලය ඇත්තේය. පියවූ දෙවියන්වහන්සේ මේ බලය මට දුන්සේක."

යේසුස්වහන්සේ අපගේ පව් වෙනුවෙන් මළසේක. එසේම උන්වහන්සේ අපට සදාකාල ජීවනය දෙනු පිණිස නැවත නැගිටුණුසේක. අපට උන්වහන්සේගේ සෙනඟවන්ට අවශ්‍ය නම් අප උන්වහන්සේ අදහාගෙන ඒ අනුව යායුතුය.

## පැනගිය ළමයා

දෙවියන්වහන්සේ අපට කොතරම් ප්‍රේමකරණසේක්ද යන්න පෙන්වීමට මෙබඳු කථාන්තරයක් කීසේක. පුතුන් දෙදෙක් සිටි මනුෂ්‍යයෙක් විය. ඔහු ඔවුන්ට ඉතා ප්‍රේමකළ බැවින් ඉතා හොඳින් රැකබලා ගත්තේය. ඔවුන්ට ඕනෑකරන සියල්ල තිබුණේය.

නමුත් දවසක්ද, බාල පුත්‍රයා පියාට කථාකොට:

"පියාණෙනි, මට අයිතිවන කොටස ලබාගන්ට ප්‍රමාදවන්ට අවශ්‍ය නැත. මට එය දැන් සිටම වියදම් කරන්ට අවශ්‍යය"යි කීවේය. මේ නිසා පියා ශෝක වුවත්, ඔවුන්ගේ කොටස් වෙන්කර දුන්නේය.

තවටික දිනක් ගතවූ පසු බාල පුත්‍රයා කථාකොට: "පියාණෙනි, මට තවදුරටත් මෙහි ජීවත්වන්ට ආශාවක් නැත. මම පිටරටකට ගොස් ජීවත්වන්ට ආශාකරමි"යි කියා තමාගේ කොටස ගෙන ගෙදරින් පිටත්ව ගියේය.

ටික දිනකින් මේ තරුණයා දුර රටකට ගොස්, තමාට මිත්‍රයන් සපයා ගත්තේය. ඔව්හු ඔහුගේ වස්තුව නාස්තිකරමින් වියදම් කරන්ටත් නොයෙක් සාද පවත්වන්ටත් අනුබල දුන්නෝය. වටිනා ඇඳුම් සහ කෑම්බීම් සඳහා ඔහුගේ ධනය නාස්ති කෙළේය. ඔහුගේ මුදල් තිබෙනතුරු ඔහු බොහෝ සතුටින් ජීවත්විය.

මෙසේ කලක් ගතවිය. ඔහු සතුව තිබූ සියල්ල වියදම් කොට අවසාන විය. ඒ දවස් වලදී ඒ රටේ සාගතයක්ද විය. දැන් ඔහුට කිසිවක් කරගත නොහැක. කුසගින්න වැඩිවත්ම කෑම සොයාගන්නේ කෙසේදැයි ලතැවෙන්ට විය.

ඔහු, එක් සතුන් ඇතිකරන ගොවියෙකු වෙතට ගොස් ඉතා යටහත් ලෙස රක්ෂාවක් ඉල්ලා සිටියේය. ඒ තැනැත්තා මේ තරුණයා තමාගේ ඌරන් බලාගැනීමට යෙදවිය. ඔහුට කෑම නොලැබුන විට ඌරන් කන කෑම කා ජීවත්වීමට පවා සිදු විය.

අන්තිමේදී ඔහු සිතන්ට විය. "ගෙදරදී අපට ඕනෑ තරම් කෑම තිබුණේය. මාගේ ගෙදර සේවකයන් පවා ඔවුන්ට ඕනෑ තරමටත් වඩා ආහාර ඇතිව සිටියෝය. නමුත් මම මෙහි කන්ට දෙයක් නැතිව දැන් මරණයට පවා ආසන්නව සිටිමි." මම මාගේ පියාණන් වෙතට ගොස් "පියාණෙනි! මම ඔබටත් ස්වර්ගයටත් විරුද්ධව පව් කළෙමි. මම තදුරටත් ඔබගේ

පුත්‍රයා යයි කියන්ට නොවටිමි. මට ඔබේ වැඩකාරයෙකු මෙන් ජීවත්වන්ට අවසර දුනමැනව"යි කියා යාච්ඤා කරමියි සිතා ගත්තේය.

එසේ සිතා ඔහු ගෙදරට හැරීයන්ට පිටත්විය. ඔහු එනවා දුරදීම දුටු පියා, තමාගේ මෝඩවූ පව්කාරවූ පුත්‍රයා කෙරෙහි කොයිතරම් ප්‍රේමයකින් සිටියේදැයි කිවහොත්, වහා ඉදිරියට දුවගොස් පුත්‍රයා වැළඳගෙන මුහුණ සිප ගත්තේය.

තරුණයා පියාට කථාකරමින් "පියාණෙනි, මම ස්වර්ගයටත් ඔබටත් විරුද්ධව පව් කෙළෙමි. මා එතරම් නරක වූවෙකු බැවින් ඔබගේ පුත්‍රයා යැයි කියන්ට නොවටිමි"යි කීවේය.

නමුත් ඔහුගේ පියා ඒ කීමට ඇහුම්කන් නොදී; සේවකයන්ට කථාකොට, "ඉතා හොඳ වස්ත්‍ර ගෙනැවිත් මොහුට අඳවාපල්ලා, මොහුගේ අතේ මුදුවක් දමා පාදවලට වහන් දමාපල්ලා"යයි කීවේය. තමාගේ නැතිවූ පුත්‍රයා නැවත හමුවීම ගැන පියා අතිශයින් ප්‍රීතියට පත්ව මහත් මංගල භෝජනයක් සූදානම් කෙළේය.

වැඩිමහළු පුත්‍රයා පියාගේ කෙත්වල වැඩ කරමින් සිට ආපසු ගෙදර එනවිට ගෙදර දෙසින් මහත් මංගල ඝෝෂාවක් ඇසෙන්නට විය. නැටීම්, ගී ගැයීම් ඔහුට ඇසෙන්නට විය. ඔහු තම සේවකයන්ට කථාකර, "මේ මංගල ඝෝෂාව කුමක් සඳහාදැ"යි ඇසුවේය.

ඔවුන් කථාකොට, "මහතාණනි, ඔබගේ සහෝදරයා ආපසු පැමිණ සිටියි. ඔබගේ පියා ඔහු වෙනුවෙන් මහත් මංගල සාදයක් පවත්වන්නේය"යි කීවෝය.

ඒ ඇසීමෙන් වැඩිමහල් සහෝදරයා කෝපයට පත්ව ගෙදරට යාම ප්‍රතික්ෂේප කළේය.

එවිට ඔහුගේ පියා ඉදිරියට ගොස් ඔහුට ගෙදරට එන

ලෙස ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටියේය. නමුත් ඔහු පිළිතුරු දෙමින් "මම අවුරුදු ගණනාවක් ඔබ වෙනුවෙන් මෙසේ කීකරුව සේවය කෙළෙමි. මම හැම කාරණයේදීම ඔබගේ වචනයක් කඩ නොකෙළෙමි. එහෙත් ඔබ මා වෙනුවෙන් කිසිදක මෙබඳු මංගල භෝජනයක් පිළියෙල නොකෙළෙහිය. නමුත් ඔබ වෙනුවෙන් කිසිත් නොකළ ඔබේ ධනය විනාශ කළාවූ ඔබගේ නාස්තිකාර පුත්‍රයා පැමිණිවිට ඔබ මෙබඳු මංගල්‍යයක් පිළියෙල කළේය"යි කීවේය.

එවිට පියා, "මාගේ ප්‍රේමවන්ත පුත්‍රය! ටිකකට ඇහුම්කන් දෙන්න. නුඹ මට ඉතාම ආසන්නය. මා සතු සියල්ල නුඹගේය. නමුත් මේ මංගල භෝජනය පැවැත්වීම යුතුය. මක්නිසාද ඔහු නුඹගේ සහෝදරයාය. ඔහු මැරී සිට දැන් පැමිණියේය. ඔහු දැන් ජීවත්වෙයි. ඔහු නැතිවී සිට දැන් හමුවීය"යි කීවේය.

## ධනවතා සහ හිඟන්නා

යේසුස්වහන්සේ ස්වර්ගයත් අපායත් පිළිබඳව මේ කථාන්තරය කීසේක. "එක්තරා ආත්මාර්ථකාමී ධනවතෙක් සිටියේය. ඔහුට බොහෝ ධනය තිබුණු බැවින් වටිනා ඇඳුම් ඇතුළුව මුදලට ගතහැකි සියලු සැපසම්පත් ඔහු භුක්ති වින්දේය. දවසක් ලාසරුස් නම් ඉතා දිළිඳු හිඟන්නෙක් ධනවතාගේ ගෙයි දොරකඩ සිට, ඔහු බොහෝ රෝගාතුරව, බඩගිනිව, සිටි බැවින් ධනවතාගේ මේසයෙන් ඉවතට විසිකරන කෑබලි අහුලා කෑවේය. බල්ලෝ පැමිණ ඔහුගේ සුවනොවන වන ලෙවකෑවෝය. ටික දිනකින් ඔහු මළ බැවින් දේවදූතයෝ ඔහුගේ ආත්මය ඔසවා දෙවියන්වහන්සේගේ දරුවන් සිටින තැන ආබ්‍රහම් සමඟ තබනු ලැබීය.

ධනවතාද මරණයට පත්ව ඔහුගේ ආත්මය සදාකාල දුකෙන් පිරී අපායට හෙළන ලද්දේය. ඔහු එහිදී කිවනොහැකි තරම් මහත් දුකට පත්විය. ලාසරුස් ආබ්‍රහම් සමඟ මහත් සැපතින් සිටිනු දුටු ධනවතා ආබ්‍රහම්ට කථාකොට: ආබ්‍රහම් පියාණෙනි! ලාසරුස් මෙහි එවා ඔහුගේ ඇඟිලි තුඩක් පමණ වතුරේ ගිල්වා මාගේ උගුර තෙමන්ට සැලසුව මැනවි. මම මේ ගිනිදැල් මැද බොහෝ වෙදනා විඳිමි"යි කීවේය.

නමුත් ආබ්‍රහම් ඔහුට කථාකොට: "පුත්‍රය! නුඹ ජීවත්ව සිටියදී බොහෝ සැපසම්පතින් තනිව භුක්තිවින්ද බව සිහි කරපන්න. මේ ලාසරුස්ට කිසිවක් තිබුණේ නැත. ඔහු බෝහෝ දුකින් ජීවත් විය. ඉතින් දැන් ඔහු බොහෝ සැප විඳින අතර නුඹ බොහෝ දුක් විඳියි. ඒ හැරුණු විට නුඹ සිටින තැනත් අපත් අතරේ කිසිවෙකුට එහා මෙහා යානොහැකි මහත් කුහරයක් ඇත්තේය"යි කීවේය.

එවිට ධනවතා කථාකොට: "අහෝ පියාණෙනි! එසේ නම් ඔහු ආපසු මිනිසුන් ජීවත්වන ලෝකය වෙත යැව්ව මැනවි. ඔහු මාගේ සහෝදරයන් පස්දෙනෙක් සිටින මාගේ පියාගේ නිවසට යැව්ව මැනවි. එසේ ගිය විට මා සිටින මේ දුක් විඳින ස්ථානයට ඔවුන්ද නොපැමිණෙන පිණිස ඔවුන්ට අවවාද කළ හැකිවේ"යැයි කීවේය.

නමුත් ආබ්‍රහම්, "බයිබලය තුලින් දෙවියන්වහන්සේ ඔවුන්ට ඇතිතරම් තත්වය පැහැදිළි කර අවවාද කර ඇත. ඔබේ සහෝදරයන්ට ඒවා ඇති තරම් කියවා දැනගන්ට අවස්ථා ඇතැ"යි කීවේය.

එහෙත් ඔහු නැවතත් කථාකර, "ආබ්‍රහම් පියාණෙනි! ඔවුන් ඒවා කියවා දැනගන්ට මහන්සි ගන්නේ නැත. නමුත් යමෙක් නැවත මළවුන්ගේ ලෝකයෙන් ආපසු යැව්වොත්

ඔවුන් විශ්වාසකොට පව්කාර ජීවිතයෙන් මිදී යහපත්කම් කරනවා ඇතැ"යි කීවේය.

"ඔවුන් දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් ඔවුන්ට කියාදුන් දේ පිළිගෙන අදහන්ට ඔවුන් සූදානම් නැතිකළ මළවුන් අතරින් කෙනෙක් ආපසු නැගිට ඔවුන් වෙත ගියත් ඔවුන් අදහන්නේ නැතැ"යි ආබ්‍රහම් පිළිතුරු දුන්නේය.

යේසුස්වහන්සේ මේ කථාන්තරය කීවේ මනුෂ්‍යයෙක් ධනවත් වුවත් දුප්පත් වුවත් මරණයට පත්ව ස්වර්ගය හෝ අපාය හිමිකර ගන්නේය. යමෙක් තමාගැනම සලකා දෙවියන්වහන්සේගේ වචනයට කීකරු නොවී පව් කරන්නේ නම් ඔහු මරණින් පසු අපායේ සදාකාල දුක විඳින්නේය. නමුත් යමෙක් දෙවියන්වහන්සේ අදහාගෙන උන්වහන්සේගේ කැමැත්ත කරන්නෙහි නම් හෙතෙම දෙවියන්වහන්සේ සමඟ සදාකල්හිම ස්වර්ගීය සැප විඳින්නෝය. අප මරණයෙන් මතු ලබන ජීවිතයට මෙලොව ජීවිතය සාක්ෂියකි.

## යේසුස්වහන්සේ ළදරුවන්ට ප්‍රේමකළසේක

දවසක්දා මව්වරු සිය දරුවන් යේසුස්වහන්සේ වෙතට ගෙන ආහ. නමුත් යේසුස්වහන්සේ බොහෝ අවිවේකීව සිටිය බැවින් උන්වහන්සේ වෙතට ගෙන නොඑන ලෙස ගෝලයෝ මව්වරුන්ට අණ කරමින් "මේ වෙලාවේ දරුවන් ගෙනැවිත් උන්වහන්සේට කරදර නොකරන්න"යයි කීවෝය. නමුත් යේසුස්වහන්සේ එය අසා; "ළදරුවන් මා වෙතට එන්ට ඉඩ හරින්න. ඔවුන් වලක්වන්ට එපායැ"යි උන්වහන්සේ කීසේක. එසේ කියා නවදුරටත් "ස්වර්ග රාජ්‍යය මෙබඳුවන්ගේ"යැයි කීසේක.

එසේ කියා උන්වහන්සේ ඔවුන් පිට අත තබා ඔවුන්ට ආශීර්වාද කළසේක. උන්වහන්සේ ඔවුන්ට ප්‍රේමකළා

පමණක් නොව ඔවුන් තමන්වහන්සේ අනුව එනවාටද කැමති වූසේක.

## පොහොසත් තරුණයෙක්

එක්තරා ධනවන්ත තරුණයෙක් යේසුස්වහන්සේ වෙතට පැමිණ "ස්වර්ගරාජ්‍යය උරුම කරගන්නා පිණිස කුමක්කළ යුතුද"යි උන්වහන්සේගෙන් ප්‍රශ්න කළේය.

යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, ඔබ ව්‍යවස්ථාව රක්ෂාකරන්නේ නම් ඔබට ස්වර්ගරාජ්‍යය උරුම කරගත හැකියැයි කීසේක.

"ව්‍යවස්ථාවේ කවර කාරණාද"යි ඔහු නැවත පිළිවිසියේය. යේසුස්වහන්සේ එයින් සමහරක් මතක් කරදෙමින් "මිනී නොමරව; සොරකම් නොකරව; බොරු නොකියව; තාගේ පියාටත් මව්ටත් ගෞරව කරව; තට මෙන් තගේ අසල්වැසියාටත් ප්‍රේම කරව යන මේවායි" කීසේක.

"එසේය, මම ඒ සියල්ලම කීකරුකමෙන් පැවැත්වීමි"යි කියා "තව මා විසින් කුමක් කරණු ලැබිය යුතුද"යි විමසීය.

යේසුස්වහන්සේ ඔහුට කථාකොට: "ඔබ සම්පූර්ණත්වයට පැමිණිය යුතුනම්, ඔබ ආපසු ගොස් ඔබ සන්තක සියල්ල විකුණා මුදල් දුප්පතුන් අතර බෙදදෙන්න. එවිට ස්වර්ගයෙහි ඔබට මහත් ධනයක් රැස්ව ඇත්තේය. එසේකොට මා අනුව එන්නැ"යි කීසේක.

නමුත් මෙම තරුණයා බොහෝසෙයින් ධනවත් කෙනෙකු බැවින් මහත් කණස්සල්ලෙන් යුතුව හැරී ගියේය. ඔහු දෙවියන්වහන්සේට කීකරුවන්ට ආශා කළ නමුත් ඔහුගේ ලෞකික වස්තුව බොහෝ බැවින් එයින් ඉවත්වන්ට ඔහුට නොහැකිවිය. ඔහු සියල්ලට වඩා උතුම්වූ ආඥාව

එනම්, "ඔබගේ මුළු හෘදයෙන් දෙවියන්වහන්සේට ප්‍රේමකළ යුතුය" යන ආඥාව නොපැවැත්විය.

## අන්ධ මනුෂ්‍යයන් දෙදෙනා

පාරක් අසබඩ සිඟාකමින් සිටි අන්ධයන් දෙදෙනෙක් වූහ. දවසක් ඔවුන් දෙදෙනා පාරදිගේ මහත් සමූහයක් එන බව ඝෝෂාවෙන් දැනගත්තෝය.

මේ සෙනඟ කුමක් නිසාදැයි සෙවූ ඔවුන් යේසුස්වහන්සේ ඒ පාරේ යමින් සිටින බව අසා, "උතුමාණෙනි! උතුමාණෙනි! අපවෙත පැමිණෙන්න. අපට අනුකම්පා කරන්නැ"යි බොහෝකොට කෑ ගසා ඉල්ලා සිටියෝය. යේසුස්වහන්සේ ළංවන විට කෑ නොගසන ලෙස සෙනඟ ඔවුන්ට තර්ජනය කරද්දීත් ඔව්හු වඩ වඩාත් ඝෝෂා කරමින් යෙසුස්වහන්සේගෙන් පිහිට ඉල්ලුවෝය.

යේසුස්වහන්සේ හැරී ඔවුන් වෙතට ගොස් නතරව; "නුඹලා වෙනුවෙන් මා කුමක් කරනවාට කැමැතිදැ"යි ඇසූසේක.

ඔව්හු එකවරම "උත්තමයාණෙනි! අප සුව කළ මැනව"යි ඉල්ලා සිටියෝය.

යේසුස්වහන්සේ ඔවුන්ට මහත්සේ දයාව දක්වමින් ඔවුන්ගේ ඇස්වල අතතබා ඔවුන්ට ඒ මොහොතේම පෙනීම ලබාදුන්සේක.

## මිටි මනුෂ්‍යයා ගැළවීම ලබාගත්තේය.

කිසිවෙක් සාකෙවුස්ට ප්‍රේම නොකළේය. මිනිසුන් ඔහුට වෛර කළෝය. ආදායම් බදු එකතු කරන්නාවූ මේ නැනැත්තා මිනිසුන්ගෙන් නියම ප්‍රමාණයට වඩා බදු මුදල් අයකොට ඒ වැඩි මුදලෙන් ඔහු ධනවත් විය.

යේසුස්වහන්සේ සාකෙවුස් වාසය කළ ගෙදර තිබුණු

වීථියට පැමිණිසේක. උන්වහන්සේ අවට සිරිත් පරිදි බොහෝ සෙනග රැස්ව සිටි බැවින් සකෙවුස්ට උන්වහන්සේ දැක ගන්ට නොහැකි විය. ඔහු මිටි මනුෂ්‍යයෙකි. එබැවින් ඔහු පාරදිගේ තරමක් ඉදිරියට දුවගොස් පාර අයිනේ තිබූ ගසකට නැග උන්වහන්සේ දෙස බලාහුන්නේය.

යේසුස්වහන්සේ ගස යටට පැමිණිවිට, නතරවී උඩබලා "සාකෙවුස් ගසෙන් බිමට බසින්න; මට අද ඔබේ ගෙදරට එන්ට ඕනෑ"යයි කීසේක.

යේසුස්වහන්සේ ඔහුගේ ගෙදරට එනබව ඇසීමෙන් මහත් පුදුමයට සහ ප්‍රීතියට පත්වූ ඔහු වහා ගසින් බැස උන්වහන්සේ ඉදිරියට දුවගොස් උන්වහන්සේ තම නිවසට කැඳවා මහත් භෝජන සංග්‍රහයක් පිළියෙළ කළේය.

මෙහි සිටි සෙනග කෝපවූවෝය. සාකෙවුස් මහා දුෂ්ට මනුෂ්‍යයෙක් බව යේසුස්වහන්සේ දන්නේ නැද්ද? හැම මිනිහෙක්ම දන්නවා ඔහු දුෂ්ට මනුෂ්‍යයෙක් බව. යේසුස්වහන්සේ මොකට මොහුගේ ගෙදරට වැඩියාදැයි කෝපයෙන් එකිනෙකා අතර කතාකර ගත්තෝය.

යේසුස්වහන්සේ මේ සියල්ල දැනසිටිසේක. එසේම උන්වහන්සේ සාකෙවුස්ගේ සිත දැන සිටිසේක. ඔහු කොයිතරම් තනිවූ මනුෂ්‍යයෙක්ද, ඔහුට කොයිතරම් ගැළවුම්කරුවෙකුගේ අවශ්‍යකම තිබුණේද යන්න උන්වහන්සේ දැනසිටිසේක.

යේසුස්වහන්සේ මේ ලෝකයට වැඩියේ සාකෙවුස් වැනි පව්කාරයන් ගළවාගන්ටය.

සාකෙවුස් ස්වාමීන්වහන්සේ වෙතට පැමිණ; "උතුමාණනි! මම මට අයිති ධනයෙන් දෙකෙන් කොටසක් දුප්පතුන් උදෙසා දෙන්නෙමි. මම යමෙකුගෙන් සොරකමින් අයකොට ඇති මුදල මෙන් සිව් ගුණයක් ඔහුට ආපසු ගෙවමි"යි කීවේය.

යේසුස්වහන්සේ ඔහුට උත්තර දෙමින් "යහපත! මෙයින් ඔබගේ සිත දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨව ඇත. එබැවින් උන්වහන්සේ ඔබේ සියලු පව්වලට කමාවී ඔබ ගලවාගත්සේකැ"යි කීසේක.

## දුෂ්ට ගොවි සේවකයෝ

දවසක් යේසුස්වහන්සේ මේ කථාන්තරය කීසේක. කෙනෙකුට තිබුණු ඉඩම්වල මිදි වවා ඒ මිදිවතු ගොවියන්ට බදුදී තමා වෙන රටකට ගියේය.

අවුරුදු කීපයකට පසු මිදිපල රැස්කරන කාලය පැමිණිවිට, එම අයිතිකරු තම සේවකයෙක්, තමාගේ කොටස රැගෙන එන ලෙස මිදිවත්තට යැවීය. නමුත් ගොවියෝ ඔහුට තළා ස්වාමියා වෙතට හිස්අතින් ආපසු යන පිණිස එළවා දැමුවෝය.

ඔහු දෙවනුවත් වෙනත් මනුෂ්‍යයෙක් යැවීය. එහෙත් එම ගොවියෝ එසේම ඔහුට තළා එළවා දැමුවෝය.

තුන්වන වතාවටද එසේම සේවකයෙක් පිටත්කර හැරියේය. ඔහුටත් ඔවුන් ඒදේම කළෝය.

මම දැන් කුමක් කළයුතුද? මම මාගේම පුත්‍රයා මේ වතාවේ යවමි. සමහරවිට ඔවුන් ඔහුට ගරු කරනවා ඇතැයි සිතා තම පුත්‍රයා යැවීය.

නමුත් ගොවියන්, ගොවිපල අයිතිකරුගේ පුත්‍රයාම එනවා දැක; "මේ වතාවේ අපගේ බලාපොරොත්තුව ඉටුවේ. මේ එන්නේ උරුමක්කාරයාය. ඔහු මරාදැමූවිට ඉඩම අපටම වන්නේය"යි කියා ඔහු අල්ලා තළා මරාදැමුවෝය.

ඉඩමේ අයිතිකරු කුමක් කරන්දැයි ඔබ සිතනවාද? ඔහු ඇවිත් එම ගොවියන් අල්ලා ඔවුන් මරාදමා, වෙනත් ගොවියන්ට එම ඉඩම භාරදුන්නේය.

යුදෙව් නායකයන් මේ කථාන්තරය අසා බොහෝසෙයින්

කිපුණෝය. යේසුස්වහන්සේ මේ කථාන්තරය කීවේ ඔවුන් පිළිබඳව බව ඔවුහු දැනගත්තෝය. මන්ද ඔවුන් දුෂ්ට ගොවියන් මෙන් දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් පන්නා දැමුවෝය. දැන් දෙවියන්වහන්සේ තම පුත්‍රයාණන්වහන්සේම එවා ඇති බැව් ඔවුහු දනිති. ඒවන විටත් ඔව්හු තම සිත්වලින් උන්වහන්සේ ප්‍රතික්ෂේප කොට ඇත. ඔව්හු උන්වහන්සේගෙන් ගැළවෙන්ට උපායක් සිතමින් සිටියෝය.

## ලෝකයේ අවසානය

යේසුස්වහන්සේ නිතර නිතරම, තමන්වහන්සේ ළඟදීම ඔවුන් අතරෙන් වෙන්ව යන බවත්, ආපසු පැමිණෙන බවත් තම ගෝලයන්ට කීසේක. එවිට ලෝකයේ අවසානය වන්නේය.

දිනක් උන්වහන්සේගේ ගෝලයෝ, ඔබවහන්සේගේ නැවත ඊම කවදා සිදුවන්නේද, ලෝකයේ අවසානය කෙසේවන්නේදැයි අපට කිව මැනවයි ඉල්ලා සිටියෝය.

යේසුස්වහන්සේ උත්තරදෙමින් "කිසිවෙක් තුඹලා මුළානොකරන්ට බලාගනිල්ලා, අන්තිම දවස්වලදී ලෝකය කෙළවරවන්ට පළමුවෙන්, ඔබ මා අනුව එතොත් මම ගළවා ගනිමියි" කියමින් බොහෝ දෙනෙක් මාගේ නාමයෙන් එනවා ඇත. බොරුකාරයන්වන ඔවුන් විශ්වාස නොකරන්න.

තවද, ඔබ ලෝකයේ බොහෝතැන්වල යුද්ධ ගැන අසනවා ඇත. ඒත් එය කෙළවර නොවන්නේය. ඊට පළමුවෙන් මේ දේවල්ද සිදුවිය යුතුය. ඒ ඒ ජාතීන් එකිනෙකාට විරුද්ධව කැරළි ගසන්නේය. ලෝකයේ නොයෙක් තැන්වල සාගත වන්නේය. ගිනි කඳු පුපුරායාම් සිදුවන්නේය. නමුත් එයද අවසාන කාලය නොවේ. මීට වඩා

බොහෝ භයානක දේ ඉදිරියට සිදුවන්ට ඇත.

ඉන්පසු ලොව මුළුල්ලේ ඔබ මා අනුව යන්නන් වන බැවින් ඔබට තළා මරණයට පවා පත්කරන්නහුය. ලොව සැම තැනම ඉතා භයානක කෲර සිදුවීම් ඇතිවන්නේය.

අන්තිම දවස්වලදී ක්‍රිස්තුභක්තිකයෙකුව සිටීම ඉතා දුෂ්කර වන්නේය. ඒ කාලයේදී බොහෝදෙනා මට ද්වේෂකොට මා අතහැර යන්නේය. ඔවුහු මට කිසිසේත් ප්‍රේම නොකොට එකිනෙකා ඇණ කොටාගන්නේය. අන්තිමය දක්වා මට විශ්වාසව සිටින තැනැත්තා ගලවනු ලබන්නේය.

අන්තිම දවස් වලදීද ශුභාරංචිය ලොව පුරා සියලු ජාතීන් වෙත දේශනාකරනු ලබන්නේය. එවිට අවසානය වන්නේය.

මාගේ ආපසු පැමිණීමට පළමුවෙන් අති බිහිසුණුදේ සිදුවන්නේය. යම්ලෙසකින් කාලය කෙටිකරන නොලද්දේනම් කිසිවෙක් නොගැළවෙන්නේය. ඉතිහාසයේ සිදුනොවූ නොඇසූ පරිදි දුෂ්ට පලිගැනීම් දරුණු ක්‍රියා ලොවපුරා සිදුවන්නේය. නමුත් දෙවියන්වහන්සේ තමන්වහන්සේ තෝරාගත්තවුන්ගේ ගැළවීම පිණිස කාලය කෙටිකරන නොලද්දේය.

මේ කාලයේදී බොහෝ බොරු ක්‍රිස්තුවරු පැමිණෙන්නෝය. ඔවුනුත් “මා අනුව එන්න, මම ගළවාගනිමියි”යි කියන්නෝය. ඔවුන්ගෙන් සමහරු මවිතකරන ආශ්වර්ය ක්‍රියා කරන්නෝය. ඔවුන් විශ්වාස නොකරන්න. ඔවුන් කිසිවෙක් දෙවියන්වහන්සේ වෙතින් ආවෝ නොවෙති.

මාගේ නැවත ඊම විදුලිය මෙන් වන්නේය. මුළු අහස පුරා දීප්තිමත් ආලෝකයක් පැතිරයන්නේය. මා ආවිට මා අනුව ආවුන් ඔවුන්ට වෛර කළ ලෝකයෙන් ඉවතට ගන්නෙමි. ඒ නිසා වැරදීමක් විය නොහැක. ඒ මොහොතේදී කෙනෙහි

වැඩකරමින් සිටින දෙදෙනෙකුගෙන් එක් කෙනෙක් ඉවතට ගනුලබන්නේය. අනික් තැනැත්තා අත්හරිනු ලබන්නේය. ගෙදරක සිටින ස්ත්‍රීන් දෙදෙනෙකුගෙන් එක් තැනැත්තියක් ගනුලබන්නීය. අනික් තැනැත්තී අත්හරිනු ලබන්නීය.

එබැවින් ඔබ හැමවිටම සූදානමින් සිටිය යුතුය. ස්වාමීන්වහන්සේ කොයි මොහොතේ එනසේක්දැයි කිසිවෙක් නොදනිති. එබැවින් ඔබත් උන්වහන්සේගේ ගෝලයෙකුවීම මොහොතකින්වත් ප්‍රමාද නොකළ යුතුය. අප හැම දෙනාම උන්වහන්සේ කෙරෙහි අදහාගෙන මේ මොහොතේ සිටම උන්වහන්සේ අනුව යායුතුය. එසේ කොට උන්වහන්සේ පැමිණෙන ඕනෑම මොහොතක් පිණිස සූදානම්ව සිටිමු.

## මනාලියන්

යේසුස්වහන්සේ මෙබඳු කථාන්තරයක්ද කීසේක. මනාලයා මුණගැසීමට පෙරමුණට ගිය මනාලියන් දසදෙනෙක් වූවෝය. රාත්‍රිකාලයේ ගිය බැවින් ඔවුන් අත පහනක් බැගින් ගෙනයන්ට තිබුණේය. නමුත් ඔවුන් අතරෙන් පස්දෙනෙක් පමණක් පහනට තෙල්ද ගෙනයන්ට සිතූ ඥානවන්තියෝ වූවෝය. ඉතිරි පස්දෙනා මෝඩයන්වූ බැවින් ඔවුහු තෙල් ගෙනයන්ට නොසිතුවෝය.

නමුත් මනමාලයා එවිටම නොපැමිණියේය. ඔහු එනවිට මධ්‍යම රාත්‍රියවූ බැවින් මනාලියෝ නිදාගෙන සිටියෝය. එවිට මනාලයා පැමිණෙන බවට ඝෝෂාවක් ඇසී මනාලියෝ වහා සිටි තැන්වලින් නැගිට තම තමන්ගේ පහන් දල්වන්ට වූ නමුත් පස්දෙනෙකුගේ පහන් තෙල් නැති බැවින් නිවීගියේය. එවිට ඔවුහු තෙල් ඇතිවුන්ට කන්නලව් කරමින් තෙල් ටිකක් ඉල්ලූවෝය.

නමුත් තෙල් ඇතිව සිටි පස්දෙනා කථාකොට, බෙදා ගැනීමට තරම් වැඩිපුර තෙල් අප ළඟ නැත. එබැවින් ගබඩාවට ගොස් තමාටම තෙල් මිළදී ගන්නයයි කීවෝය.

ඔවුන් තෙල්ගන්ට ගොස් සිටියදී මනාලයා පැමිණ, මංගල උත්සව ශාලාවට ගියවිට සූදානම්ව සිටි මනාලියන් පස්දෙනාද ඇතුළට ගියෝය. එවිට ශාලාවේ දොරටුව වසා දමන ලදී.

පසුව තෙල්ගන්ට ගිය මනාලියෝ පැමිණ දොර හරින ලෙස තට්ටුකරමින් මහතාණෙනි! අපටත් ඇතුළට එන්ට දොරහැරිය මැනවයි ඉල්ලා සිටියෝය.

එවිට මනාලයා ඇතුලේ සිට, "ඉවත්ව යන්න! ඔබ ප්‍රමාදවූවා වැඩිය"යි කීවේය.

යේසුස්වහන්සේ මේ කථාන්තරය කීවේ උන්වහන්සේගේ පැමිණීම සූදානමින් බලාසිටින පිණිසය. උන්වහන්සේගේ සැබෑ අනුගාමිකයින් පමණක් හැමවිටම උන්වහන්සේගේ පැමිණීම බලා සූදානම්ව සිටිති. ඔවුන් පමණක් සදාකල්හිම උන්වහන්සේ සමඟ සිටින පිණිස ස්වර්ගරාජ්‍යය වෙතට ගනුලබති. එසේ සූදානම්ව නොසිටින සියල්ලෝ තීරණයක් ගැනීමට සූදානම් නුවූ බැවින් ඉවතට හෙලනු ලබති.

## මනුෂ්‍යයාගේ අවසාන විනිශ්චය

යේසුස්වහන්සේ තවත් කථාන්තරයක් කීසේක. "එක්තරා කෙනෙක් තමා ඉතා දුරු රටකට යන්ට පෙර ඔහුගේ සේවකයන් තිදෙනා කැඳවිය. එසේ කැඳවා තමාගේ ව්‍යාපාර සඳහා යොදවා තවත් උපදවනු පිණිස එකිනෙකාගේ බුද්ධිමත්කමේ හැටියට පළමුවෙනියාට තලෙන්ත පන්දහසක්ද, දෙවෙනියාට තලෙන්ත දෙදහසක්ද, තුන්වෙනියාට තලෙන්ත දහසක්ද දී "මා එනතුරු මේ මුදල් ව්‍යාපාරවල යොදවා දියුණු කළ යුතුය"

කියා තමාගේ ගමන ගියේය.

තලෙන්ත පන්දහසක් ලැබූ තැනැත්ත වහාම ක්‍රියාත්මක වෙමින් බඩු මිළට ගැනීමෙන් හා ඒවා ලාභ තබා විකිණීමෙන් වැඩිකල් යන්ට පෙර තවත් තලෙන්ත පන්දහසක් උපදවා එය දෙගුණ කළේය. දෙවෙනියාද තමා ලත් තලෙන්ත දෙදහස ව්‍යාපාරයන්හි යොදවා ස්වල්ප කාලයකින් තවත් තලෙන්ත දෙදහක් උපදවා එය දෙගුණ කෙළේය.

තුන්වෙනියා පොළොවේ වලක් හාරා එය එහි වළලා දමා ආරක්ෂා කළේය.

ස්වාමියා සෑහෙන කාලයක් පිටරට සිට ආපසු පැමිණ තම සේවකයන් තිදෙනා කැඳවා ඔවුන් එම තලෙන්ත කෙසේ වර්ධනය කළෝදැයි විමසීය.

තලෙන්ත පන්දහස ලැබූ තැනැත්ත තවත් තලෙන්තා පන්දහසක් එයින් ඉපදවූ බව දැක ස්වාමියා ඉතා ප්‍රසන්නව "ඔබ ඉතා විශ්වාසව මේ දේ කළබැවින් ඔබ තවත් උසස් දේ කෙරෙහි විශ්වාසය තබන්නෙමි. ප්‍රීතිවන්න! ඔබ බොහෝ උතුම්වූ වැඩෙහි යොදවන්නෙමි"යි කියා, දෙවෙනියා කැඳවිය.

තලෙන්ත දෙදහසක් ලැබූ දෙවෙනියාගෙන් විමසූවිට "ස්වාමිනී! ඔබ මට තලෙන්ත දෙදහසක් දුන්නෙහිය. මම එය ව්‍යාපාරයෙහි යොදවා තවත් දෙදහසක් උපදවාගෙන දෙගුණ කෙළෙමි"යි කීවේය.

එය ඇසූ ස්වාමියා, "යහපත් දාසය! ඔබ කෙරෙහි මහත් දේ කෙරෙහි විශ්වාසය තැබිය හැකි බව දැන් මම දනිමි. ඔබටද බොහෝකොට දෙන්නෙමි"යි කියා තුන්වෙනියා කැඳවිය.

ඔහු උත්තර දෙමින්, "මහතාණනි! ඔබ තදවූ සිත් ඇති කෙනෙකු බව දැනසිටිමි. මා එම තලෙන්ත දහස

ව්‍යාපාරයෙහි යොදවා තව ඉපදවී නම් ඔබ ඒ මුදල් මගෙන් ගන්නා බව දනිමි. එබැවින් මම එය වළලා ආරක්ෂ කෙළෙමි. මෙන්න ඔබ දුන් තලෙන්ත දහසයැ"යි පෙන්වීය.

එවිට ස්වාමියා ඔහුට කථාකොට, "දුෂ්ටවූ අසලවූ දාසය; නුඹ මා තද කෙනෙකු බව දැනසිටියෙහිය. එබැවින් එම මුදල ව්‍යාපාරයන්හි යොදවා දියුණු කරන්ට ඉඩ තිබුණි. අඩු වශයෙන් එය බැංකුවක තැන්පත් කෙළෙහි නම් ටිකක්වත් වැඩි කරන්ට තිබුණි"යි කියා එම තලෙන්ත දහස ඔහුගෙන් ගෙන තලෙන්ත දසදහසක් තිබුණු තැනැත්තාට දී එම දුෂ්ට සේවකයා පිටතට දැමීය.

"යම්කිසි මනුෂ්‍යයෙකුට ලැබුණු දෙය නිවැරදි ලෙස පාවිච්චි කරයි නම් ඔහුට තව තවත් දෙනු ලැබේ. නමුත් යම්කිසි මනුෂ්‍යයෙක් තමාලද දෙය වැරදිලෙස පාවිච්චි කෙළේ නම් ඔහුට ඇතිදේත් ගනුලබන්නේය" කියා යේසුස්වහන්සේ ඉන්පසු මේ කථාන්තරයේ අදහස කියාදුන්සේක.

මෙය කියන ලද්දේ උන්වහන්සේ ගැනමය. තවද උන්වහන්සේ මෙසේ කීසේක. "දවසක මම මේ ලෝකයෙන් ඉවත්ව යන්නෙමි. නැවත පසුව දවසක මගේ සියලු දේවදූතයන් සමඟ ආපසු විත් මගේ සිංහාසනයෙහි හිඳගෙන සියලු ලෝකයා විනිශ්චය කරන්නෙමි."

සියලු ජාතීන් මා වෙතට පැමිණිය යුතුය. මම ඔවුන් එළුවන් අතරේ බැටළුවන් වෙන් කරන්නාක් මෙන් වෙන් කරන්නෙමි. බැටළුවෝ මගේ දකුණු පැත්තටත් එළුවන් වම් පැත්තටත් වෙන්කරනු ලබන්නහුය. ඉන්පසු මාගේ දකුණු පසින් සිටින්නවුනට, "ඔබ වෙනුවෙන් වෙන්කොට ඇති මාගේ රාජ්‍යයට ඇතුල්වන්න. දෙවියන්වහන්සේ ඔබට ආශීර්වාදකරනසේක. මක්නිසාද මට බඩගිනිවූ විට ඔබ මට කන්ට දුන්නෙහිය. මා පිපාසයෙන් සිටින විට ඔබ මට

බොන්ට දුන්නෙහිය. මා ආගන්තුකව සිටි විට ඔබ මා පිළිගත්තහුය. මම ඇඳුම් නැතිව සිටි විට ඔබ මට ඇඳුම් දුන්නහුය. මා රෝගීව හෝ සිරගෙයි සිටිවිට ඔබ මා බලන්ට ආවාහුයයි කියමි"යි කීසේක.

එවිට එම ගුණවන්ත මනුෂ්‍යයෝ "මහතාණෙනි! ඔබ කවදා බඩගිනිව සිට, අපි කෑම දුනිමුද? පිපාසිතවූ ඔබවහන්සේට බොන්ට යමක් දුනිමුද? ආගන්තුකව පැමිණි ඔබ පිළිගතිමුද? නිර්වස්ත්‍රව සිටි ඔබට ඇඳුම් දුනිමුද, නැත්නම් ඔබ කිසිදාක රෝගීව සිට අපි බලන්ට ආවෙමුදැ"යි අසන්නහුය.

එවිට මම මෙසේ පිළිතුරු දෙන්නෙමි. "ඔබ මාගේ මේ සහෝදරවරුන්ගෙන් කෙනෙකුට එසේ කළානම් එය මට කළාවන්නේය.

පසුව මම මගේ වම්පසින් සිටින්නවුන්ට කථාකොට මෙසේ කියන්නෙමි. "සාපලද්දෙනි! මා කෙරෙන් ඉවතට යව. යක්ෂයා සහ ඔහුගේ දූතයන් වෙනුවෙන් සූදානම් කොටඇති ගින්නට නුඹලා හෙලනු ලබන්නහුය. මක්නිසාද කුසගිනිව සිටි මට නුඹලා කන්ට නුදුන්නහුය. පිපාසිතව සිටි මට යමක් බොන්ට නුදුන්නහුය. ආගන්තුකවූ මා පිළිනොගත්තහුය. නිර්වස්ත්‍රව සිටි මට ඇඳුම් නුදුන්නහුය. රෝගීව හෝ සිරගෙයි හෝ සිටි මා බලන්ට නාවහුයැයි කියමි."

එවිට ඔවුන් මගෙන්, "අපට කවදාවත් කුසගිනිව හෝ පීඩිතව හෝ නිර්වස්ත්‍රව හෝ ආගන්තුකව හෝ සිරගෙයිහි හෝ රෝගාතුරව හෝ සිටි ඔබ මුණගැසී ඇද්දැ"යි අසනු ඇත.

මමද, "මගේ මේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට පවා නුඹලා ඒ දේ නොකළ බැවින් මට නොකළාහුයැයි කියන්නෙමි"යි කීසේක.

## අන්තිම රාත්‍රි භෝජනය

දෙදිනකට පසු පසුකර යාමේ මංගල්‍යය පවත්වන දිනය පැමිණියේය. දුෂ්ට යුදෙව් නායකයෝ ඒ වනතුරු උන්වහන්සේ අත්අඩංගුවට ගැනීමට සුදුසු අවස්ථාවක් සොයමින් සිටියෝය. උන්වහන්සේ මරණයට පත්කිරීමට ඔවුන්ට අවශ්‍ය විය. එහෙත් පාස්කු මංගල්‍යයේදී එසේ කිරීමෙන් කැරළිගැසීමක් ඇතිවිය හැකියැයි ඔව්හු බියවූහ.

මේ අවස්ථාවේදී ඉතා දුක්සහිත සිදුවීමක් විය. යේසුස්වහන්සේගේම ගෝලයන් අතුරෙන් කෙනෙක්වූ යූදස් ඉස්කාරියොත් යුදෙව් නායකයන් වෙතට පැමිණ, මට ඔහු අල්ලාගන්ට උපකාරවන්ට පුළුවනැයිද, මම ඔහු සිටින යනඑන තැන් දනිමියි කීවේය. මක්නිසද ඔහු රහසින් මුදල් වලට ආශාකළ කෙනෙක්විය.

ඒ දුෂ්ට මනුෂ්‍යයෝ ඉතා ප්‍රසන්න වූවෝය. මෙය ඔවුන්ට අත්‍යවශ්‍යව තිබූ කාරණයයි. ඔව්හු යූදස්ට ඒ පිණිස රිදී මිළ 30ක් ගාස්තුව වශයෙන් ගෙවීමටද පොරොන්දුවූහ.

මින්පසු යූදස් උන්වහන්සේ ඔවුන් අතට පාවා දෙන්ට සුදුසු වේලාවක් සහ අවස්ථාවක්ද බලමින් සිටියේය.

සූදානම්වීමේ පළමුවන දවසේදී යේසුස්වහන්සේ යෙරූසලමට ගෝලයන් දෙදෙනෙකු යවා, පාස්කු මංගල්‍යය භෝජනය සූදානම්කිරීමට උපදෙස් දුන්සේක. සවස් වන විට ඔව්හු එහිගොස් මංගල මේසයට වාඩිවූහ.

යේසුස්වහන්සේ ඔවුන්ට කථාකරමින් "මෙහි වාඩිවී සිටින ඔබ අතරෙන් කෙනෙක්, මා මරන්ට සතුරන් අතට මා පාවාදෙන්නේය"යි කීසේක. මේ ඇසීමෙන් ඔවුන් මහත් දුකට පත්ව එකිනෙකා "ස්වාමිනී, ඒ මමද"යි උන්වහන්සේගෙන් අසන්ට පටන්ගත්තෝය.

"ඒ තැනැත්තා දුන් මා සමඟ කෑමකන ඔබ දොළොස්දෙනා අතරෙන් කෙනෙකැ"යි කීසේක. "බොහෝ

කලකට පෙර දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් කියාතිබූ පරිදි මා නසින්ට ඕනැය. නමුත් මා පාවාදෙන්නාට බොහෝ දුක් වන්නේය. ඔහු නූපන්නානම් ඔහුට වඩා හොඳය"යි වදාළසේක.

ඔවුන් කෑමකමින් සිටියදීම යේසුස්වහන්සේ රොටියක් ගෙන, දෙවියන්වහන්සේට ස්තුතිකොට, කඩා, "ගෙන කන්න, මෙය මාගේ ශරීරයයි" කියා ඔවුන් අතර බෙදූසේක. ඉන්පසු උන්වහන්සේ මිදියුෂ භාජනයක් ගෙන, එයින් හැමදෙනාම පානයකරන පිණිස, ඊට ආශීර්වාදකොට වටේට යවමින්, "මේ බොහෝදෙනා උදෙසා වගුරුවන මාගේ රුධිරයයි" කීසේක.

මෙසේ උන්වහන්සේ මරණයට පත්වනබව සියල්ලන්ට ප්‍රකාශකළසේක. එසේ මරණයට පත්වීමෙන් උන්වහන්සේ කෙරෙහි අදහාගත්තවුන් ගැළවීම ලබන්නෝය.

## යේසුස්වහන්සේ තම ගෝලයන්ගේ පා සේදීම

යේසුස්වහන්සේ මංගල මේසයෙන් නැගිට සේවකයකු මෙන් හැඳගෙන, වතුර භාජනයක් පුරවාගෙන එක් එක් ගෝලයාගේ පාද සෝදා පිසදමන්ට වූසේක. පාරවල් ධූලිසහිත බැවින් ඇවිදීමෙන් ඔවුන්ගේ පාද කිළිටිව තිබුණේය.

පේත්‍රුස්ගේ වාරය පැමිණිවිට ඔහු වළකමින් "ස්වාමීන්වන ඔබවහන්සේ මෙසේ අපගේ පාද සේදීම යුතු නැතැයි" කීවේය.

යේසුස්වහන්සේ උත්තර දෙමින් "මා මේ දේ කරන්නේ කුමක් පිණිසදැයි ඔබ දැන් තේරුම් නොගන්නහුය. නමුත් යම් දවසක ඔබට එය වැටහේය"යි කීසේක. පේත්‍රුස්; "නැත මම ඔබවහන්සේට මගේ පා සෝදන්ට නොදෙන්නෙමි"යි කීය. යේසුස්වහන්සේ කථාකොට "ඔබ ඉඩ නොදෙන්නේනම් ඔබ

මගේ හවුල්කරුවකු නොවේය"යි කීසේක.

එවිට පේත්‍රුස්, "එසේනම් මාගේ අතුත් හිසත් සේදුව මැනවි. නමුත් මගේ පාද නොසේදුව මැනව"යි කීවිට උන්වහන්සේ පිළිතුරු දෙමින් "යමෙක් හිසසෝදා නෑගී සිටින්නෙහි නම් නැවත පවිත්‍ර වීම පිණිස අවශ්‍යවන්නේ පාසේදීම පමණය. ඔබ පවිත්‍රය නමුත් මෙහි සිටින සියල්ලෝම එසේ නොවේය"යි කීසේක.

උන්වහන්සේ මෙසේ කීවේ, ඉතා කළු පාපයකින් හදවත අපවිත්‍රවී සිටින යූදස් ඉස්කාරියෝත් ගැන සිතමිනි. ඔහු මුදලකට තමාගේම ස්වාමීන්වහන්සේ පාවාදෙන්නට කැමතිවිය. ඔහුගේ පවිත්‍රකරනු ලැබුවේ පාද පමණක් බැවින් ඔහු පවිත්‍රකෙනෙක් නොවේ.

යේසුස්වහන්සේ මේ දේ අවසන්කොට නැවත තමන්වහන්සේගේ ඇඳුම් ඇඳගෙන මේසයේ වාඩිවී කථාකරන්ට පටන්ගත්තේය.

"ඔබ තේරුම්ගත්තෙහිද? ඔබ ස්වාමීනියි මට කියන්නහුය. එය හරිය. නමුත් ඔබේ ඒ ස්වාමියා සහ ගුරුවරයා, ඔබේ පාද සේදූකළ ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. මා අනුව යමින් මා කළදේ ඔබත් කළ යුතුව ඇතැ"යි කීසේක.

මෙයාකාරයෙන් උන්වහන්සේ තමාගේ අනුගාමික-යින්වන්ට කැමැත්තාහු අන්‍යයන්ට මෙහෙකළ යුතු අතර, තමන් අන්‍යයන්ගෙන් එය බලාපොරොත්තු නොවිය යුතු බව ඉගැන්වූසේක.

## ගෙත්සෙමෙන උයනේදී

රාත්‍රී භෝජනයෙන් පසුව සියල්ලෝම ගෙත්සෙමෙන උයන කරා ගියෝය. එහි පැමිණි පසු උන්වහන්සේ ගෝලයන් අමතා, "දැන් ඔබ මගෙන් සැඟවී මෙතැනින්

පලායනවා ඇත. නමුත් මා නැගිටුනු පසු නැවත ඔබ හමුවන්ට එමි"යි කීසේක.

එවිට පේතෘැස් උත්තර දෙමින් "අන් අය කුමක් කළත් මම ඔබවහන්සේ හැර පළානොයමි"යි කීවේය.

යේසුස්වහන්සේ, "පේතෘැස්! ඔබ හෙට අලුයම කුකුළා දෙවරක් හඬලන්නට පෙර තුන්වරක් මා හඳුනන්නේ නැතැයි කියනු ඇත"යි කීසේක.

"නැත ස්වාමිනි! මම කිසිලෙසකින්, මරණයට මුහුණ දෙතත් ඔබවහන්සේ නාඳුනමියි නොකියමි"යි කීවේය. අන් සියල්ලෝද එසේම කීවෝය.

යේසුස්වහන්සේ ඔවුන් අතුරෙන් පේතෘැස්ද, යාකොබ්ද, යොහාන්ද කැඳවාගෙන ඉවතට ගොස් "මාගේ ආත්මය මැරෙන තරම් ශෝකව තිබෙයි. මා සමඟ අවදිව සිටින්නැ"යි ඉල්ලා සිටිසේක.

ඉන්පසු උන්වහන්සේ තනිවම තව ඉදිරියට ගොස් බිමවැටී දෙවියන්වහන්සේට යාච්ඤාකරමින්, "පියාණෙනි, ඔබවහන්සේට සියල්ල පුළුවන. ඔබවහන්සේ කැමති සේක්නම් මේ පීඩා මගෙන් පහකළ මැනව. එහෙත් එය ඔබවහන්සේ කැමති ලෙසින් මිස මාගේ කැමැත්ත අනුව නොවේවා"යි කීසේක. තව නොබෝ වේලාවකින් විඳින්නට යන දුක්ගාවිනා අති භයානක බව උන්වහන්සේ දන්නාසේක. මෙසේ තව දෙවතාවක්ම උන්වහන්සේ තනිව යාච්ඤා කළසේක. ඒ එක් එක් වතාවේ එසේ යාච්ඤාකොට ආපසු පැමිණ බලන කළ ඔවුන් සියල්ලන්ම නිදාසිටිනු දුටුසේක.

උන්වහන්සේ විඳින්ට යන වේදනා ගැන ගෝලයන්ට අවබෝධයක් තිබුනේ නැත.

මොහොතකින් පහන් ආලෝකය සමඟ මිනිසුන් ඝෝෂාකරන හඬ ඇසෙන්නට විය. ඒ ශාන්ත උයන වෙත

කලබලකාරී රංචුවක් දුව එමින් සිටියහ. ඔවුන් පොලුවලින්ද කඩුවලින්ද අවි දරා සිටියහ. ඔවුන් සමඟ යූදස්ද විය. "මම එහි ගොස් යමෙක් සිපවැළඳ ගනිම්ද, ඔහු අත්අඩංගුවට ගතයුතු තැනැත්තාය"යි කලින්ම තම සගයන්ට කියා තිබුණි.

යූදස් එතැනට පැමිණි විට ඉදිරියට ගොස් මිත්‍රයෙක් සිඹින්නාක් මෙන් "ස්වාමීනි!"යි කියා උන්වහන්සේ සිප වැළඳ ගත්තේය. එවිට ඔහු සමඟ පැමිණි සමූහයා උන්වහන්සේ අල්වා ගත්හ.

## යේසුස්වහන්සේ විභාගකරනු ලැබීම සහ පේත්‍රුස් හඳුනන්නේ නැතැයි කීම

යේසුස්වහන්සේ උත්තම පූජකයාගේ නිවෙසට ගෙනගියේය. සියලු යුදෙව් නායකයෝ වහාම එතැනට රැස්වූහ.

පේත්‍රුස් බොහෝ පිටුපසින් ගමන්කොට දොරටුවෙන් ඇතුලට රිංගාගෙන ගිනිගොඩක් අසලටවී සේවකයින් සමඟ ගිනි තපිමින් උන්නේය.

ඇතුලේ දුෂ්ට යුදෙව් නායකයන් එක්ව උන්වහන්සේ මරණයට පත්කිරීමට තරම් සුදුසු පැමිණිලි ගොනුකරමින් උන්හ. බොහෝ දෙනා ඉදිරියට පැමිණ බොහෝ බොරු ගොතා කිවූ නමුත් උන්වහන්සේ හසුකරගන්ට නොහැකිවිය.

අවසානයේදී උත්තම පූජකයා "නුඹ ක්‍රිස්තුස්ද? දෙවියන්වහන්සේගේ පුත්‍රයාද"යි ඇසීය.

යේසුස්වහන්සේ "එසේය"යි කීසේක.

උත්තම පූජකයා මහත් දුකක් ප්‍රකාශකරනු පිණිස තමාගේ ඇඳුම් ඉරාගෙන "අපට තවත් අවශ්‍ය මොනවාද? තවත් සාක්ෂිකරුවන් කුමටද? ඔහු දෙවියන්වහන්සේට

විරුද්ධව කථාකරනවා ඔබලාටම ඇසුනා නොවේද"යි කීවේය.

ඔවුන් සියල්ලෝම එක හඬින් "ඔහු මරණයට පත්කළ යුතුය" යි කීවෝය.

ඉන්පසු ඔව්හු උන්වහන්සේගේ ඇස් බැඳ පිටතට ගෙන යද්දී සමහරු උන්වහන්සේගේ මුහුණට කෙළගැසූහ. සමහරු උන්වහන්සේගේ මුහුණට මිටින් පහර දුන්හ. එසේ ඔව්හු උන්වහන්සේට හැකිතරම් නින්දා කළෝය.

පේත්‍රුස් පිටත ගිනි තපිමින් සිටි තැනට පැමිණි එක් තරුණියක් ඔහු දෙස බලා, "නුඹත් යේසුස් සමඟ සිටි අයගෙන් කෙනෙකි" යි කීවේය.

පේත්‍රුස්, "නැත, නුඹ කියන දේ මම නොදනිමි"යි කීවේය. ඒ මොහොතේම කුකුළා හැඬලීය. එතැනින් පේත්‍රුස් වෙනත් තැනකට ගියවිට එතැනදීද එම තරුණිය වෙනත් අයට පේත්‍රුස් පෙන්වමින්; "බලන්න! අර මිනිහා යේසුස්ගේ ගෝලයෙකි" යි කීවාය.

මෙවරද පේත්‍රුස් "නැතැ"යි කියා එතැනින් ඉවත්වූ නමුත් තවත් අය "නුඹ ඇත්ත වශයෙන්ම යේසුස්ගේ ගෝලයෙකි. මන්ද නුඹ සමාරියයෙකි"යි කීවිට පේත්‍රුස් දිව්රමින් සාපකරමින්, "නැත, නුඹලා කියන මේ මනුෂ්‍යයා මම කිසිවිට දැනසිටියේවත් නැතැ"යි කියමින් සහතිකවත්ම කුකුළා දෙවෙනි වරට හැඬලීය.

මෙවිටම පේත්‍රුස්ට යේසුස්වහන්සේ පෙර රාත්‍රියෙහි කීදෙය සිහිවී, තමා තම ස්වාමින්වහන්සේ නාඳුනමියි තුන්වරක් කිවුනිසා අතිශයින් ශෝකවිය.

## යේසුස්වහන්සේ පිලාත් ඉදිරිපිටට ගෙනයාම

පසුදා අලුයම යේසුස්වහන්සේ පිලාත් ඉදිරිපිටට ගෙනගියහ. ඔහු රෝම ආණ්ඩුකාරයා විය. ඔවුන් ඔහු

ඉදිරිපිටදී උන්වහන්සේ කළ අපරාධ වශයෙන් බොහෝ බොරුගොතා කීවෝය.

එවිට පිලාත් යේසුස්වහන්සේගෙන් "තමාට මේ පිළිබඳව කුමක් කියන්ට ඇත්තේද?; මේ චෝදනා ඇත්තදැ"යි විමසීය. නමුත් යේසුස්වහන්සේ කිසි උත්තරයක් නුදුන් හෙයින් පිලාත් මවිතවිය.

හැම අවුරුද්දේම පාස්කු මංගල්‍යයෙහිදී යුදෙව් සිරකරුවෙකු නිදහස්කර හැරීම පිලාත්ගේ සිරිතවිය. එහෙත් එසේ කළ යුත්තේ යුදෙව්වන්ගේ ඉල්ලීම අනුවය.

යේසුස්වහන්සේ නිදහස්කරන්ට සිතූ පිලාත්, "නුඹලා වෙනුවෙන් මා නිදහස්කරන සිරකරුවා ක්‍රිස්තුස් වනවට නුඹලා කැමතිදැ"යි විමසීය.

"අපට ඕනෑ බරබ්බස්ය"යි ඔව්හු කෑගැසූහ. බරබ්බස් මිනීමරුවෙකි.

"එසේ නම් යුදෙව්වන්ගේ රජයැයි නුඹලා කියන මේ මනුෂ්‍යයාට මක්කරන්ටදැ"යි ඇසීය. මේවනවිට යේසුස්වහන්සේට විරුද්ධව ඔවුන් කළ කුමන්ත්‍රණයක් මිස ඇත්ත වශයෙන්ම උන්වහන්සේ වරදක් කර නැතැයි ඔහුට අවබෝධවී තිබුණි.

"ඔහුව කුරුසියෙහි ඇණගැසුව මැනව"යි යුදෙව්වෝ එවිට එක හඬින් ඝෝෂාකළෝය.

එවිට "මක්නිසාද, ඔහු කළ වරද කුමක්ද?" කිය පිලාත් ඇසුවිටත්, කරුණු කිසිවක් නොකියා "ඔහුව කුරුසියේ ඇණගැසුව මැනව"යි කියාම කෑගැසූහ. පිලාත් යේසුස්වහන්සේව නිදහස්කළ යුතුව තිබුනත් සෙනඟට බයේ එසේ නොකළේය. මෙතැන කැරළිගැසීමක් වියහැකි යැයි ඔහු සිතුවේය. එබැවින් ඔහු ඔවුන්ගේ ඉල්ලීම පරිදි බරබ්බස් නිදහස් කර යේසුස්වහන්සේ කුරුසියේ ඇණගසනු ලැබීම පිණිස එතැනින් පිටත්කර හැරියේය.

## යූදස් දිවිනසාගැනීම

යේසුස්වහන්සේ මරණයට පත්කරන්ට යෙදෙන බව දුටුවිට යූදස් ඔහු කළ ද්‍රෝහිකම ගැන බලවත්සේ කම්පාවට පත්විය. ඔහු යුදෙව් නායකයන් වෙත ගොස් තමා ලබාගත් මුදල ආපසු ඔවුන්ට දුන්නේය.

"මම පව් කළෙමි" කිසිවරදක් නොකළ මේ මනුෂ්‍යයා පාවාදීමෙන් මරණයට පත්කිරීමේ පාපය කෙළෙමියි කීවේය.

එවිට යුදෙව්වෝ "එය නුඹට වේවා" කියා මුදල් භාර නොගත්තෝය.

එයින් පසු ඔහු එම රිදීමිළ බිමදමා ගොස් ගසක එල්ලී සියදිවි නසාගත්තේය.

## යේසුස්වහන්සේ කුරුසියේ මරණයට පත්කොට වැළලූහ

හේවායෝ යේසුස්වහන්සේ පිටතට ගෙනගියෝය. ඉන්පසු ඔවුන් උන්වහන්සේට බලවත් වේදනා ගෙනදෙන ලෙස කස පහරදී උන්වහන්සේට නිග්‍රහ කළෝය. ඉන්පසු රජෙකුට මෙන් දම් පැහැයෙන් යුත් වස්ත්‍රයක් හඳවා දික්වූ උල් කටු සහිත වැලින් ඔටුන්නක් ගොතා හිසේ පළඳවා, "යුදෙව්වන්ගේ රජු" යයි කෑගසමින් අපහාස කළහ. සමහරු ලීවලින් හිසට තැලූහ. එබඳු නිග්‍රහ කරමින් නැවත නැවතත් "යුදෙවන්ගේ රජ" යැයි කියමින් දණින් වැටී ආචාරකළෝය. සමහරු උන්වහන්සේගේ මුහුණට කෙළගැසූහ.

උන්වහන්සේට බලවත්සේ පීඩා සහ නින්දාකිරීමෙන් වෙහෙසට පත් ඔව්හු උන්වහන්සේ කුරුසියෙහි ඇණගසනු පිණිස ගෙනගියහ. වෙනත් අපරාධකරුවන් දෙදෙනෙකුද උන්වහන්සේ සමඟ ඇණගැසීමට නියමව සිටියහ.

නගරයෙන් පිටතවූ වධක භූමිය වෙත වරදකරුවන්ට කුරුසිය ඇදගෙන යායුතුව තිබුණි. එතරම් දුරවූ හිස්කබල ස්ථානයකට, යේසුස්වහන්සේට කුරුසිය ගෙනයාමට තරම් ශක්තියක් නැතිවන පරිදි ඔවුහු උන්වහන්සේ දුර්වල කොට තිබුණු බැවින් සමූහයා අතර සිටි සීමියෝන් නම් මනුෂ්‍යයෙක් උන්වහන්සේට උපකාරවිය.

සොරුන් දෙදෙනා දෙපසින් වනසේ උන්වහන්සේ මැද කුරුසියෙහි ඇණගැසූහ. "මේ යුදෙව්වන්ගේ රජය" කියා දැන්වීමක් ලියා එයද උන්වහන්සේගේ හිසට ඉහළින් කුරුසියට තබා සවිකළහ.

උන්වහන්සේ මෙලෙස වද වේදනා, නින්දා අපහාස විඳිමින් සිටියදී, යේසුස්වහන්සේ "පියාණෙනි, මොවුන් කරන්නේ කුමක්දැයි නොදැන කරන අපරාධයට මොවුන්ට කමාකළ මැනව"යි කියා යාච්ඤා කළසේක.

හේවායෝ උන්වහන්සේගේ කුරුසියේ පාමුල සිට උන්වහන්සේගේ ඇඳුම් පිණිස දාදුදැමූහ.

යුදෙව් නායකයෝ මහත්සේ සිනාසෙමින්; 'හා! අපි බලමු, ඔහු වෙනත් අයට බොහෝ උපකාරී වූවා. අනුන් ගැළවූ ඔහු තමාම ගළවාගන්න හැටි අපි බලමු. එතකොට ඔහු ක්‍රිස්තුස් ලෙස අපිත් පිළිගනිමු'යයි කියමින් නින්දා කළෝය.

හේවායෝ උන්වහන්සේට තිත්ත මිශ්‍ර කාඩි බොන්ට දුන්නෝය. උන්වහන්සේට නින්දාකරමින් ඔව්හු "නුඹ යුදෙව්වන්ගේ රජු නම් දැන් කුරුසියෙන් බැසපන්නැ"යි කීහ.

උන්වහන්සේ සමඟ කුරුසියේ ඇණගසනු ලැබූවන් දෙදෙනාගෙන් එක් අපරාධකරුවෙක්, "නුඹ ක්‍රිස්තුස් නම් තමාම ගැළවී අපත් ගළවාගනින්නැ"යි නින්දා කළ අතර අනික් තැනැත්තා, ඔහුට කථාකොට "නුඹ මැරෙන මොහොතේවත් දෙවියන්වහන්සේට භයවන්නේ නැද්ද? අපි අප කළ දුෂ්ටකම් වලට සුදුසු දඬුවම් ලබමු නමුත්

මුන්වහන්සේ කිසිවරදක් කර නැතැ"යි කියා යේසුස්වහන්සේ දෙසට හිස හරවා "යේසුස්වහන්ස! ඔබවහන්සේගේ රාජ්‍යයට ගියවිට මා සිහිකළ මැනව"යි කීය.

උන්වහන්සේ පිළිතුරු දෙමින් "සැබවින්ම නුඹ අද මා සමඟ පාරාදීසයෙහි සිටින්නෙහියැ"යි කීසේක.

මේ වනවිට දවසේ මධ්‍යහ්න වේලාව විය. හිර අඳුරු වී පැය තුනක් පුරා මහත් අන්ධකාරයක් විය. එවිට යේසුස්වහන්සේ ශබ්දනගා "පියාණෙනි, මාගේ ආත්මය ඔබට භාරදෙමි"යි කියා මළසේක.

මේ දුටු සියල්ලෝ මහත්සේ බියපත්ව ශෝකවූහ. උන්වහන්සේ කුරුසියේ ඇණගැස්වූ සියයකට නායකයා කථාකරමින් "සැබවින්ම මොහු ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකැ"යි කීවේය.

මේ අතර යුදෙව්වන්ගේ ප්‍රධානියෙක් වූ යෝසෙප් නම් මනුෂ්‍යයෙක් විය. නමුත් ඔහු වෙනත් යුදෙව් නායකයන් මෙන් දුෂ්ටයෙක් නොවීය. ඔහු දෙවියන්ට භය ඇතිව සිටි යහපත් මනුෂ්‍යයෙක් විය. ඔහු පිලාත් වෙතට ගොස් යේසුස්වහන්සේගේ මිනිය ඉල්විය.

එසේ ඔහු යේසුස්වහන්සේගේ මිනිය ඉල්ලාගෙන දිග ලිනන් රෙද්දකින් ඔතා ගෙනගොස් කඳු පාමුලක ඇතුලට හාරාතිබූ අලුත් සොහොනක තැන්පත් කළේය. එබඳු ගල්ගුහාවල තැන්පත් කළහැකි වූයේ ධනවතුන්ට පමණකි.

යේසුස්වහන්සේගේ සිරුර තැන්පත් කරනලද්දේ එබඳු ගල්ගුහාවකය. පසුව විශාල ගල්දොරකින් සොහොනෙහි කට වසාදමන ලදී. යේසුස්වහන්සේ හැඳින සිටි ස්ත්‍රීවරු කීපදෙනෙක් මිනිය සමඟ සොහොන්ගේ ළඟට ගොස් පසුව යුදෙව්වරුන්ගේ සිරිතේ හැටියට පසුදා උදේ සොහොන් ගෙට සුවඳ කවන්ට සුවඳ ද්‍රව්‍ය සූදානම්කරන්ට වූහ. එහෙත්

පසුවදා මංගල්‍යය දවසක්වූ බැවින් සොහොන වෙත යාම වරදක් හෙයින් පසුවදා පාන්දරින් ඔවුන් සොහොන් ගෙය වෙත ගියහ.

## යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටුණු සේක

පසුදින වූ ඉරිදා අලුයම සොහොන වෙත ගිය ඔව්හු එතැනට ගියවිට කුමක් දුටුවෝද?

ඒ මහා ගල ඉවතට පෙරලා දමා තිබුණි. ඔවුන් සොහොන තුළට ගොස් බැලූවිට උන්වහන්සේගේ මිනිය එහි නොවීය.

ඔවුහු ඉතා පුදුමයෙන් හා සැකයෙන් කුමක් සිදුවන්ට ඇත්දැයි සිතා කලබල වූහ. එවිටම මිනිසුන් දෙදෙනෙක් ඔවුන් ඉදිරියේ පෙනීසිටියහ. ඔවුන්ගේ ඇඳුම් දිළිසෙන සුදුපාටින් විය. ඔවුන් පෙනීමෙන් දේවදූතයන් මෙන් වූහ. එවිට ස්ත්‍රීහු මහත් භීතියට පත්ව හිස නමා ඒ දෙදෙනාට ආචාර කළහ.

එවිට එම දේවදූතයන් ඔවුන් අමතා, “ජීවත්වන අය සොහොන් ගෙවල සොයන්නේ කුමටද? උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ නැගිට දැන් ජීවත්වනසේක. උන්වහන්සේ ඔබට ඉගැන්වූ දේ අමතකවීද?”

උන්වහන්සේ කුරුසියේ ඇණගසනු ලබන බවත් තුන්වන දින මළවුන්ගෙන් නැගිටින බවත් කීසේක.

එවිට ඔවුන්ට සියල්ල මතක්වී, ගෝලයන්ට සහ වෙන අයටත් සිදුවූ සියල්ල කියන පිණිස ආපසු යෙරුසලමට දිව ගියහ.

## යේසුස්වහන්සේ ගෝලයන් හට ප්‍රකාශවීම

මේ පුවත ඇසූවන්ට එය සුරංගනා කථාවක් මෙන්විය. කිසිවෙක් ඒ කීම විශ්වාස නොකළෝය.

නමුත් පේත්‍රුස් තමාම දැකගන්න පිණිස සොහොන වෙත දුවගියේය. එසේගිය ඔහු සොහොන් ගෙට එබී බැලූකළ උන්වහන්සේගේ මිනිය එතූ රෙදි එහි ගොනුකර තිබුණු නමුත් මිනිය එහි නොවීය. මේ සිදුවූ දේ කුමක්විය හැකිදැයි මවිත මෙවින් ඔහු ආපසු ගියේය.

එදම ටිකවේලාවකට පසු යේසුස්වහන්සේ සමඟ සිටියවුන් දෙදෙනෙක් එම්මාවුස් නම් ගමට යන පිණිස පිටත්ව ගියෝය. එය යෙරුසලමේ සිට සැතපුම් සතක් දුරින් පිහිටි ස්ථානයකි. ඔවුන් එසේ යන අතර යේසුස්වහන්සේගේ මරණය ගැන කථාකරමින් ගියෝය.

හදිසියේ යේසුස්වහන්සේ පැමිණ ඔවුන්ට එක්වූ සේක. උන්වහන්සේත් ඔවුන්ගේ පැත්තකින් ගමන්කළසේක.

එසේ යමින් සිටියදී උන්වහන්සේ ඔවුන්ට කථාකරමින් "ඔබ දෙදෙනා යම්කිසි ගැඹුරු සිදුවීමක් ගැන කථාකරන බව පෙනේ. ඔබ කරදර වන මේ කාරණය කිමෙක්ද"යි විමසූසේක.

ඔව්හු නතරව උන්වහන්සේගේ මුහුණ බැලූහ. එහෙත් ඒ මොහොතේ ඔවුන්ට උන්වහන්සේ හැඳිනගන්ට නොහැකිව දුක්මුසු පෙනුමෙන් යුතුව; එක්කෙනෙක්, "යෙරුසලමේ ජීවත්වන අය අතුරින් පසුගිය සතියේ එහි සිදුවූ භයානක සිදුවීම නොදැන සිටින එකම මනුෂ්‍යයා ඔබද"යි ඇසීය.

"ඒ කුමක්ද"යි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූකළ.

"නාසරෙත්හි යේසුස්වහන්සේ! උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දූතයෙක්. උන්වහන්සේ ඉතා පුදුම ගෙනදෙන ආශ්චර්‍යමත් ක්‍රියා කළසේක. උන්වහන්සේ උත්තම ආචාරීන්වහන්සේ කෙනෙක්. දෙවියන්වහන්සේත් මනුෂ්‍යයාත් විසින් මහත්සේ ප්‍රේමකරනු ලැබූ කෙනෙක්.

නමුත් අපගේ දුෂ්ට නායකයෝ උන්වහන්සේට වෛරකළා. ඔව්හු උන්වහන්සේ අල්වාගෙන රෝම

ආණ්ඩුකාරයා අතට පාවාදුන්නා. උන්වහන්සේ වරදකරුවකුසේ සළකා ඔවුන් උන්වහන්සේ කුරුසියේ ඇණගසා මරණයට පත්කළා. එය සිද්ධවී දැනට දවස් තුනක් ගතවී තිබෙනවා"යි කීවෝය.

එයින් නොනැවතී, "අපි උන්වහන්සේ ක්‍රිස්තුස්ය කියා බලාපොරොත්තුව සිටියා. අපි හිතුවා උන්වහන්සේ අපගේ රට ගළවාගන්ට ආ කෙනෙක් කියා. නමුත් දැන් මරණයට පත්වෙලා."

'අද අලුයම ස්ත්‍රීන් කීපදෙනෙක් සොහොන වෙත ගියවිට, උන්වහන්සේගේ මිනිය එහි නුවූ බවත්, දේවදූතයන් දෙදෙනෙක් එහි සිට, උන්වහන්සේ ජීවත්ව සිටියයි යන මහත් පුදුම ආරංචිය දුවගෙන විත් අපට කීවා.'

"සමහරු සැබෑදැයි බලන පිණිස එහි ගියවිට, ඔවුන් කියා ඇත්තේ සැබෑව බව වැටහී තිබෙනවා. මිනිය එතැන තිබී නෑ" යනුවෙන් මුළු සිද්ධිය විස්තර කළහ.

එවිට උන්වහන්සේ උත්තර දෙමින් "ඔබලා මොනතරම් මෝඩ මනුෂ්‍යයෝද? දෙවියන්වහන්සේගේ වචනය විශ්වාසකරන්ට එතරම් අපහසු මන්ද? එසේ සිදුවනබව ශුද්ධලියවිල්ලෙහි ලියාතිබෙනවා. දෙවියන්වහන්සේගේ වචනය මනුෂ්‍යයා වෙත ගෙනවුත් කියා තිබෙනවා, ක්‍රිස්තුස්වහන්සේ එනබව. උන්වහන්සේට මේ සියල්ල සිද්ධවෙන බව කියානැද්ද?" යි අසා ඔවුන්ට මෙතෙක් ඔවුන් තේරුම්ගෙන නොතිබුණු ශුද්ධලියවිලි කොටස් කීපයක් මතක්කරදී ඒවා තෝරාදුන්සේක.

මේ වෙලාව වනවිට ඔවුන් එම්මාවුස් නගරයට ළංව සිටි අතර සවස්වී තිබෙන බැවින් ඔවුන්ගේ නිවෙසට පැමිණ ඔවුන් සමඟ නවාතැන් ගන්නාලෙස උදක්ම ඉල්ලා සිටියෝය. එසේ උන්වහන්සේ ඔවුන් සමඟ ගෙදරට වැඩිසේක.

සියල්ලන් රාත්‍රිකෑමට වාඩිවූ කළ උන්වහන්සේ රොටියක් ගෙන දෙවියන්වහන්සේට ස්තුති කොට කඩා ඔවුන්ට දුන් මොහොතේ ඔවුහු උන්වහන්සේ හැඳිනගත්තෝය. නමුත් ඒ මොහොතේ උන්වහන්සේ අතුරුදහන්වූ සේක.

ඔවුන් දෙදෙනා එකිනෙකාගේ මුහුණු බලමින් මහත් ප්‍රීතියෙන් හා පුදුමයෙන්, උන්වහන්සේ ජීවත්වන බව විශ්වාස කළෝය. ඔවුන් සමග කථාකළේ යේසුස්වහන්සේ බව දැනගත්තෝය.

එම රාත්‍රියේම පැයක් ගතවන්නට පෙර ඔවුන් ආපසු යෙරුසලමට යන්ට පිටත්වූහ. එහි ගිය විට ගෝලයන් එකොළොස්දෙනා මහත්සේ ප්‍රීතියෙන් සිටිමින්, යේසුස්වහන්සේ පේත්‍රුස්ට හමුවී කථාකළ බවත්, උන්වහන්සේ ජීවත්වන බවත් කීවෝය. "සැබවින් උන්වහන්සේ ජීවත්වනසේක."

එවිට එම්මාවුස් ගමේ සිට පැමිණි දෙදෙනා ඔවුන්ගේ අත්දැකීම් කියන්ට පටන්ගෙන, "අපි මුලින් උන්වහන්සේව හඳුනාගත්තේ නැත. නමුත් කෑමට වාඩිවූ පසු රොටි රැගෙන එය කඩා ආශීර්වාද කළ නිසා අපි උන්වහන්සේ හැඳින ගතිමු. එහෙත් ඒ මොහොතේම උන්වහන්සේ අතුරුදහන්වූ සේක."

ඔවුන් එසේ කථාකරමින් සිටින අතර යේසුස්වහන්සේ ඔවුන් අතර පෙනීසිට ඔවුන්ට ආචාර කළසේක.

ඔවුන් කොයිතරම් තිගැස්සීමකට පත්වුනාද යත් ඒ හොල්මනකැයි සිතූහ.

යේසුස්වහන්සේ නැවත ඔවුන්ට කථාකරමින්, "ඔබ ඔයතරම් භයවන්නේ මන්ද? ඒ මා බව අදහාගන්ට බැරිද? මාගේ අත් හා පාවල තුවාළ බලන්න. මම සැබෑකෙනෙකු මිස ආත්මයක් නොවන බව මේ අත් පාවල තුවාල අත තබා

බලන්න." එසේ කියමින් උන්වහන්සේගේ අත් හා පාවල තුවාල පෙන්වූසේක.

එහෙත් ඔවුහු ප්‍රීතියෙන් හා පුදුමයෙන් කුල්මත්ව බලා උන්හ.

එවිට යේසුස්වහන්සේ මෙහි කෑමට යමක් ඇද්දැයි ඇසූසේක. ඔව්හු බැදපු මාළු කැල්ලක් දුන්හ. උන්වහන්සේ එය ගෙන අනුභවකරන කළ, ඔව්හු "ඇත්තෙන්ම ආත්මයක් කෑම නොකයි. සැබවින්ම ඒ උන්වහන්සේමය"යි කියාගත්තෝය.

නැවත උන්වහන්සේ ඔවුන්ට කථාකරමින් "මා කලින් ඔබ සමග සිටියදී, මෝසෙස් සහ වෙනත් අනාගතවක්තෘවරුන් මා ගැන කියා තිබූ කරුණු මතක්කළ නොහැකිද"යි ඇසූසේක. ඉන්පසු උන්වහන්සේ ගෝලයන්ට කරුණු පැහැදිළිකර දෙමින් "එය සැබවි! ක්‍රිස්තුස්වහන්සේ දුක්විඳින්ටත් මරණු ලබන්ටත්, තුන්වෙනි දින මළවුන්ගෙන් නැගිටින්ටත් ඕනෑබව අසා නැද්ද? ඒ ගැළවුම්කාරයාණෝ යුදෙව්වන් පිණිස පමණක් නොව ලෝකයේ සියලු මනුෂ්‍යය වර්ගයා පිණිස වනසේක"යි කීසේක.

"මා අදහාගන්නා කවරෙකු වුවත් පව්කමාව ලබන්නේය"යි කීසේක.

ඉන්පසු උන්වහන්සේ ඔවුන් කැඳවාගෙන නගරය දෙසට වැඩියසේක. උන්වහන්සේ ඔවුන්ට කථාකරමින් "ඔබ හැමදෙනාම තම තමන්ගේ ඇස්වලින්ම මේ දේවල් සිද්ධවනවා දුටුවෝය. දැන් මම ආපසු ස්වර්ගය වෙතට යන්නෙමි. මම ඔබ තනිකොට දමා නොයමි. ගොස් ඔබ හැමගේ හදවත් තුල සදහටම පවතින පිණිස ලෝකයට එවමි. උන්වහන්සේ පැමිණ ඔබ ශක්තිමත් කරන තුරු මේ නගරයේම නැවතිය යුතුය. ඉන්පසු ලොව මුළුල්ලේ ගොස් මනුෂ්‍යයන්ට මා පිළිබඳව ශුභාරංචිය ප්‍රකාශ කොට ඔවුනුත්

මාගේ ගෝලයන් කළ යුතුය. මා ඔබට ඉගැන්වූ දේවල් ඔවුන්ටත් ඉගැන්විය යුතුය. මම ඔබට මෙසේ පොරොන්දුවක් දෙමි. මම ඔබ සමඟ ලෝකයේ අවසානය දක්වාම සිටිමි"යි කීසේක.

උන්වහන්සේ මෙසේ කථාකරමින් සිටියදීම වළාකුලක් පැමිණ උන්වහන්සේ ඉහළට ඔසවාගනු ලැබ එම වළාකුලින් වැසී නොපෙනීගිය සේක.

එවිටම දේවදූතයන් දෙදෙනෙක් ඔවුන් ඉදිරියේ පෙනීසිට "ඔබ කුමක්නිසා මෙසේ අහස දෙස බලාගෙනම සිටින්නහුද? උන්වහන්සේ ඔසවාගනු ලැබූසේක. උන්වහන්සේ ගිය ලෙසින්ම නැවත එනවාත් දකින්නහුය"යි කීවෝය.

* * * * * * * * * * *

යේසුස්වහන්සේ තවත් මහා පුදුම දේවල් කළසේක. ඒවා මේ පොතෙහි ලියානැත. නමුත් මේවා ලියන ලද්දේ ඔබ කියවා උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව දැනගන්න පිණිසය. උන්වහන්සේ ගැළවුම්කාරයාණෝය.